# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,890 — 1970 ජනවාරි 23 වැනි සිකුරාදා — 1970.1.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 117 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 125 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 126 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 145 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 142 | විවිධ දැන්වීම් ... ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා යෙහි සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්‍ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්‍ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවය නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමිය.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රුපියල් 7,800—3×360—8,880/9,600—4×360, 10×480 සහ 3×600—17,640 ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් ය. මේ වැටුප් ක්‍රමයෙහි රුපියල් 9,600 සහ රුපියල් 13,920 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් තිබේ.

**සටහන් :**

(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රු. 13,440 වාර්ෂික වැටුප් ඉක්මවා වැටුප් ලැබීමට හිමිවන්නේ ලංඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය හෝ ලබාගත් පසුවය.

(ii) ඒ සාමාජිකත්වය ලබාගත් දින සිට එවකට රුපියල් 9,960 ක වැටුප හෝ උසස් වැටුපක් ලබමින් නොසිටිය හොත් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 9,960 ක වැටුපක් ලැබීමට අයදුම්කරුවා හිමිවේ.

4. සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 20.2.1970 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව.

(සී) (i) ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇති බව හෝ

(ii) සිවිල් ඉංජිනේරු විභාගයේ I වැනි, I බී වැනි සහ II වැනි කොටස් හෝ

(iii) ලංඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I වැනි සහ II වැනි කොටස් හෝ සමාන සුදුසුකම් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක් මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

**සැලකිය යුතුයි.**—

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවල ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිත කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරණ පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත්, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
නැ. පෙ. 500.

1–863/2—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ 107/එක්ස් 2193/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ සංඛ්‍යා ලේඛන විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල සංඛ්‍යා ලේඛන විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

1. මෙරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 20 වැනිදා.
2. පිටරට අයදුම්පත් : 1970 පෙබරවාරි මස 27 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

**2. වැටුප් දීමනා හා සේවා කොන්දේසි :—**

(i) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—11,040 පාඨමික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(ii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ දෙහිවල කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ ය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලයට පත්කරනු ලැබේ.

**3. බඳවා ගැනීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(ii) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970. 2. 20 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) (i) සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සංඛ්‍යාලේඛන විද්‍යාව විශේෂ විෂයයක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයෙක අර්ථ ශාස්ත්‍රය පිළිබඳ ගෞරව /විශේෂ උපාධියක්

හෝ

(ii) අර්ථ ශාස්ත්‍රය විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් සහ සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක්

හෝ

(iii) සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සංඛ්‍යාලේඛන විද්‍යාව විෂයයක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයයක වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක්.

හෝ

(iv) සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සංඛ්‍යාලේඛන විද්‍යාව විෂයයක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක ගණිතය පිළිබඳ ගෞරව/විශේෂ උපාධියක් ලබා තිබීම.

(ඇ) දෙහිවල කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුලදී සිංහල පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකිය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස්ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තිය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂය :**

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.
(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපෙක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත්‍ර හා ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 16 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

1–863/3—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී 105/එක්ස් 2194/69.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### නාවින්නේ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරි (ආයුර්වේද) තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරි (ආයුර්වේද) තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය, මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 පෙබරවාරි මස 20 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 පෙබරවාරි මස 27 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

**3. වැටුප් හා දීමනා :—**

මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය.

වර්ෂයකට රු. 6,720—360×12, 480×11—රු. 16,320 කි. වර්ෂයකට රුපියල් 11,520 ට හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**සටහන :—**

රු. 11,040 ත් ඔබ්බට යාමට පෙර නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගත යුතුය. වර්ෂයකට රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම වැඩ හා හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයකින් වේ.

**4. අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970 පෙබරවාරි මස 20 වැනි දිනට අවුරුදු 30ට නොඅඩු බව හා අවුරුදු 45 ට නොවැඩි බව (මෙහි උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන්ට බලපානු නොලැබේ.)

(ඇ) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක පළමුවැනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇති බව.

(ඈ) ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් විශිෂ්ඨ කීර්තියක් ලබා ඇති බව.

(ඉ) පිළිගත් ආයුර්වේද ආයතනයක ආචාර්යවරයකු සහ/හෝ වෛද්‍යවරයකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතික. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල් වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 16 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

1–863/4—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයේ අන්දමට තමන්ගේ ම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 70. 2. 20 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ, තැ. පෙ. 563, කොළඹ 7" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර පුද්ගලිකව මා නමට හෝ මෙම කාර්යාලයේ අන් කිසි නිලධාරියකු නමට නොඑවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය විශේෂ දීමනා හා සේවය පිළිබඳ කොන්දේසි.**—රු. 5,736 න් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් හා රු. 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද යුක්තව රුපියල් 9,480 දක්වා උසස් වන වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරට අයත් වේ. රු. 6,780, රු. 7,500 හා රු. 8,280 වාර්ෂික වේතනයන්ට පළමු නියම කරන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් ගෙන් සමත් විය යුතුය. තවද, පත්වීම් ලබන අයදුම්කරුවෝ ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් වලින් ඔබ්බට උසස්වීම් ලබනු සඳහා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන හෝ වෙනත් නියම කරනු ලබන විභාග ආදියෙන් සමර්ථ විය යුත්තෝ වෙති.

3. **සේවාවට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක ආධුනික සේවා කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම ඔහු හෝ ඇය පහත සඳහන් සුදුසුකම් හිමි බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ලාංකිකයකු බව ;

(ආ) 70. 2. 20 දිනට අවුරුදු 22 ට නොඅඩු හෝ අවුරුදු 35 ට නොවැඩි බව (යටත් පිරිසෙයින් පස් අවුරුද්දක අඛණ්ඩ කාලයක් ජනලේඛන හා/හෝ සංඛ්‍යාලේඛන කටයුතුවල නිරතවූ දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව අත්හැර දමනවා ඇත.) ;

(ඇ) සංඛ්‍යාති, ගණිතය, අර්ථ ශාස්ත්‍රය, ප්‍රජා විද්‍යාව, සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති බව (ගෞරව උපාධිධාරීන් කෙරේ වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.) ;

(ඈ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල, පිටපත්, ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(1) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තිස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකවල පිටපත් භාරගනු නොලැබේ.) ;

(2) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික හෝ වෘත්තීය සහතිකවල පිටපත්.

(3) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය, හැකියාව සහ වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික පත් තුනක පිටපත් (මේ ඡේදය අනුව, දැනට රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් මුල් සහතික පත්‍ර පුද්ගලිකව පවත්වන සම්මුඛ පරීක්ෂණයෙහිදී ඉදිරිපත් කරනු විනා තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලන්න.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 9 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව—සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය**

1. අයදුම් කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.
2. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
(ඉතා පැහැදිලි ලෙස ලියන්න)
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
1970. 2. 20 දිනට වයස : අවුරුදු :————. මාස :————.
දින :————.
4. විවාහක නම්, විවාහ වූ දිනය හා ළමයින් ගණන :————.
5. අධ්‍යාපනික සුදුසුකම් හා උපාධිය ලැබීම සඳහා ගත් විෂයයන් (සමර්ථ වූ දිනය හා ප්‍රධාන විෂයය වෙන් වෙන්ව සඳහන් කරන්න) :————.
6. ඉගෙනීම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස් වූ දිනය :————.
7. දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප් :————.
8. පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස් වූ දිනය :————.
(රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි.)
9. සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවය :————.
(සමර්ථවූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුය.)
10. විශේෂ සුදුසුකම් (වෘත්තීය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු සමාජ සේවා වැඩ, ශුභසාධක වැඩ) :————.
11. සංඛ්‍යාලේඛන පිළිබඳ පළපුරුදුකම් විස්තර :————.
12. පිටපත් අමුනා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකුගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.
13. අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–669—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

**කම්කරු නිලධාරි තනතුරු**

කම්කරු නිලධාරි තනතුරු සඳහා 1970 පෙබරවාරි මස 8 වන දින තෙක් ලාංකිකයින්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

**අධ්‍යාපනික සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ වඩා ඉහල විභාගයකින් හෝ සාමාර්ථය ලබා සිටිය යුතුයි. ඩිප්ලෝමා සහතිකයක් හෝ කම්කරු සම්බන්ධතා හා සුභසාධක කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා තිබීම අමතර සුදුසුකමකි. සිංහලෙන් කටයුතු කිරීම පිළිබඳ දැනුමක් අත්‍යවශ්‍යව ඇත.

**පළපුරුදුකම්.**—කම්කරු දෙපාතීමේන්තුවේ පරීක්ෂකවරුන්ගේ කාර්යයන් හා සමානවූ හෝ පෞද්ගලික අංශයේ හෝ රජයේ සංස්ථාවක හෝ ඒ හා සමාන කාර්යයන් වැනි කාර්මික හා කම්කරු සම්බන්ධතා කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම.

**වයස.**—1969. 12. 31 වන දිනට අවුරුදු 30ට නොඅඩු හෝ අවුරුදු 45 ට නොවැඩි හෝ අය විය යුත්තාහ. මණ්ඩලයේ දැනට සිටින නිලධාරීන් හට මෙම වයස් සීමාව අදාල නොවන්නේ ය.

**වැටුප් පරිමාව.**—අවුරුද්දකට රු. 5,760—240—රු. 7,200 (මෙම වැටුප් පරිමාව ප්‍රතිශෝධනයට යටත්ව ඇත.)

යථෝක්ත වැටුප් පරිමාවන්ට අමතරව රජයේ ගෙවීම් ප්‍රමාණයන්ට අනුව තාවකාලික ජීවන වියදම් දීමනා ගෙවනු ලබන අතර, නිවාස සපයා නොමැති නම් විවාහකයකු වෙනුවෙන් මූලික වැටුපෙන් 15% ක්ද, අවිවාහකයෙකු වෙනුවෙන් මූලික වැටුපෙන් 7½% ක්ද ගෙවල් කුලී වශයෙන් ගෙවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. මේ අනුව සේවකයා විසින් මූලික වැටුපෙන් 7½% ක්ද මණ්ඩලය මගින් මූලික වැටුපෙන් 10% ක්ද මෙම අරමුදල සඳහා දායක වනු ලැබේ.

තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව සිංහල භාෂාව පිළිබඳව සුදුසුකම් ලබා නැත්නම් එම සුදුසුකම් ලබාගත යුත්තාහ. තවද ඔවුන් ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සූදානම්ව සිටිය යුත්තාහ.

රාජ්‍ය සේවයේ හා රජයේ මණ්ඩලයක/සංස්ථාවක සේවය කරන අය, සිය අයදුම්පත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, අයදුම්කරුවා තෝරාගනු ලැබුවහොත් ඔහු නිදහස් කර එවීමට හැකි බව එම දෙපාතීමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුයි.

අයදුම්පත් ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සේවක කළමනාකරුගෙන් ලබාගත හැක.

අයදුම්පත් තැපැල් මගින් ඉල්ලා සිටින්නේ නම් තමාගේ නම සහ ලිපිනය සහිත මුද්දර ගැසූ ලියුම් කවරයක් සමග එසේ ඉල්ලුම් කළයුතුයි.

අයදුම්පත්, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415 දරණ ස්ථානයෙහි පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සේවක කළමනාකරු වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරෙහි සඳහන් කළයුතුයි.

අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආර්. වී. ජයසූරිය,
ප්‍රධාන ලේකම්, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

1–705—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

**ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක තනතුර (අනියම්)**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. පහත දැක්වෙන ආකෘතියේ ප්‍රකාර ඉල්ලුම් පත් 1970.2.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙනු සේ ආගමන හා විගමන පාලක, තැ. පෙ. 586, ගල්බොක්ක, කොළඹ 1 ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. **සුදුසුකම්.**—(අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම්වලින් අඩු වශයෙන් එකක් හෝ තිබිය යුතු අතර, ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට සහ දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා ප්‍රවීණත්වයක් තිබිය යුතුය.)

(1) (i) ලන්ඩන් විශ්ව විද්‍යාලීය අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ඉංග්‍රීසි හෝ දෙමළ විෂයයක් වශයෙන්,

(ii) ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ඉංග්‍රීසි හෝ දෙමළ විෂයයක් වශයෙන්,

(iii) උසස් පාඨශාලා සහතිකය ඉංග්‍රීසි හෝ දෙමළ විෂයයක් වශයෙන් (විශේෂ ඉංග්‍රීසි/විශේෂ දෙමළ නොවේ.)

(iv) ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා මධ්‍යම සහතිකය, ලංකා විශ්ව විද්‍යාලීය සාමාන්‍ය කලා යෝග්‍යතා (පළමු වැනි) විභාගය ඉංග්‍රීසි හෝ දෙමළ විෂයයක් වශයෙන්,

(v) මහා භාණ්ඩාගාරයේ සිංහල/දෙමළ ප්‍රවීණතා පරීක්ෂණයේ (ඉහල පෙළ) සමාර්ථය සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙල) හෝ ඊට උසස් විභාගයකින් දෙවැනි භාෂාව වශයෙන් (එනම් ඉංග්‍රීසි/දෙමළ) භාෂාවට අඩුම වශයෙන් සම්මාන සමාර්ථයක් ලබා තිබිය යුතුය.

(2) 1970 පෙබරවාරි 15 වැනි දිනට වයස අවුරුදු 19 කට නො අඩු අවුරුදු 40 කට නොවැඩි විය යුතුය.

(3) අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

4. **සේවා කොන්දේසි.**—තෝරා ගනු ලබන අයදුම්කරු හුදෙක්ම අනියම් පදනමක් මත පත්කරනු ලැබේ. මෙම පත්වීම රජයේ හෝ යම් ආයතනයක ස්ථිර හෝ තාවකාලික රක්ෂාවකට මොනම අන්දමේ හෝ විශේෂ හිමිකමක් ඇති නොවේ. ස්ථිර පත්වීමක් කළ විගස හෝ ඔහුගේ/ඇයගේ සේවය අනවශ්‍ය වූ විටෙක සේවය අවසන් කරනු ලබන අතර, අනතුරුව නැවත රක්ෂාව සඳහා භාණ්ඩාගාර (එක්ස්.) ශාඛාවේ ලියාපදිංචිවීමට ඔහුට/ඇයට කිසිදු අයිතිවාසිකමක් නොමැත.

5. වැඩ කරන එක් දිනකට රු. 12 ක (ඒකාබද්ධ) වැටුපක් ගෙවනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
ආගමන හා විගමන පාලක.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 586, ගල්බොක්ක පාර,
කොළඹ 1,
1970 ජනවාරි 16 දින.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තන තනතුර (අනියම්)**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.

(ලාංකිකයෙකු වූයේ (අ) පෙළපතින්ද, නැති නම් (ආ) ලියාපදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි වීමෙන් නම් පුරවැසි සහතිකයේ විස්තර සපයන්න.)

4. (අ) උපන් දිනය සහ දැනට වයස :————.

(ආ) විවාහක, අවිවාහක තත්ත්වය :————.

5. අධ්‍යාපන සුදුසුකම් සහ සමත් වූ අන්තිම විභාගය දිනය සහිතව :————.
6. කලින් පළපුරුදුකම් තිබේ නම් :————.
7. දැනට කරන රැකියාව :————.
8. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියක දී වරද කරු වී තිබේද :————.
(එසේ නම් විස්තර සපයන්න.)
9. ඔබගේ චරිතය සහ හැසිරීම සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමට හැකි නෑනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :————.
10. විශේෂ සුදුසුකම් තිබේ නම් :————.

ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව, මා තෝරා ගැනීමට කලින් දැනගත හොත් මා නුසුදුස්සෙකු විය හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහකර දැමීමට හැකි බවත් මා දන්නා බව මෙයින් සඳහන් කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–858—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**බී–3 ශ්‍රේණියේ ලඝු/යතුරුලේඛක (ඉංග්‍රීසි) තනතුර**

මෙම සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970 පෙබරවාරි මස 7 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ සේවක මණ්ඩල කළමනාකාරතැන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, 113, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ “ (ඉංග්‍රීසි) ලඝු-යතුරුලේඛක තනතුර ” යනුවෙන් සඳහන් කළ යුතුය.

3. පත්කරනු ලබන අයදුම්කරුවන් රු. $\dfrac{210 - 480}{12 \times 10 : 10 \times 15}$ වැටුප් පරිමාණයේ රු. 230 වැටුප් ලක්ෂ්‍යය මත තබනු ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

5. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුණු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965 අගෝස්තු 20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

8. ලඝුලේඛනය සහ යතුරු ලියනය පිළිබඳව අයදුම්කරුවන්ගේ ප්‍රවීණත්වය පරීක්ෂා කිරීම සඳහා කොළඹ, ලංකා කාර්මික විද්‍යාලයේදී විභාගයක් පවත්වනු ලැබේ. මේ සඳහා සෑම අයදුම්කරුවෙක්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නමින් රු. 5 වටිනාකම ඇති මුදල් ඇණවුම පතක් හෝ තැපැල් ඇණවුම් පතක් ඉල්ලුම් පත සමග එවිය යුතුය.

විභාගය පවත්වන දිනය පසුව දනුම් දෙනු ලැබේ.

9. සේවා කොන්දේසි.—(i) තෝරාගනු ලබන අයදුම්කරුවන් :—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට දහය (10%)ක් දයක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට පහළොව (15%)ක් දයක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය පිණිස අවශ්‍යය.

(ii) මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම්—අයදුම්කරුවන්—

(අ) ජ්‍යෙෂ්ඨ හෝ අ.පො.ස. (සාමාන්‍ය) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් සමත්වී තිබිය යුතුයි.

(ආ) අඩු වශයෙන් මිනිට්ටුවකට වචන 80ක වේගයෙන් ලඝුලේඛනය කිරීමට හා මිනිට්ටුවකට වචන 40ක වේගයෙන් යතුරු ලිවීමට හැකි විය යුතුයි.

(ඉ) වයස අවුරුදු 35ට වැඩි නොවිය යුතුයි.

සේවක මණ්ඩල කළමනාකාරතැන.

1970 ජනවාරි මස 11 වැනි දින,
113, ගාලු පාර,
කොළඹ 3.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය ප්‍රථමයෙන්)
3. මුල් අකුරු සමග නම :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු— මාස— දින—
7. පුරවැසිභාවය :————.
(උත්පත්තියෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග)
8. විවාහක අවිවාහක බව :
අවිවාහක බව :——— විවාහක බව :——— දික්කසාද බව :———
9. අධ්‍යාපනික පසුබිම :

| ඉගනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| .................... | .................... | ............ | ............ | ............ |
| .................... | .................... | ............ | ............ | ............ |
| .................... | .................... | ............ | ............ | ............ |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේනම් :————.
11. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :

| ආයතනයේ නම | තත්ත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| .................... | ............ | ......... | ......... | .................... |
| .................... | ............ | ......... | ......... | .................... |
| .................... | ............ | ......... | ......... | .................... |

12. දැනට ලබන වැටුප :————.
13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.
(ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න)
14. වෙනත් කරුණු :————.
15. මෙම දැන්වීමේ තනතුරු සඳහා " අවශ්‍ය සුදුසුකම් " යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදාල සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතුයි·

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත් සත්‍ය බවත් සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන්කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පුවුනි නම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනි නම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–870—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

II ශ්‍රේණියේ ගබඩා භාරකරු තනතුරක් සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—ගබඩා වැඩ පිළිබඳ යටත්පිරිසෙයින් අවුරුදු 2ක පළපුරුද්ද සහ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්.

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා සහිතව මාසිකව රු.250—10×15—රු.400කි. රු. 300 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**වයස.**—අවුරුදු 20–35 දක්වා.

මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 පෙබරවාරි මස 10 වැනි දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " II ශ්‍රේණියේ ගබඩා භාරකරු " යනුවෙන් සඳහන් කළ යුතුය.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 ජනවාරි මස 8 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම් පත

#### II ශ්‍රේණියේ ගබඩා භාරකරු තනතුර

1. සම්පූර්ණ නම :————.
(1) මුල් අකුරු සහිත නම :————.
(මහත්මයාද, මහත්මියද, මෙනවියද යන වග සඳහන් කරන්න)
(2) ලිපිනය :————.
2. උපන් දිනය හා ස්ථානය :————.
(1) 1970 පෙබරවාරි මස 10 වැනි දිනට වයස : අවු.—මාස—දින—
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
3. ජාතිය :————.
4. අධ්‍යාපන හා පුහුණුවීම් :

| ඉගෙනීම ලැබූ පාසැල් හා ආයතන | දින ......සිට ......දක්වා | සමත්වී ඇති විභාග | දැරූ වගකිව යුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| .................... | ............ | ............ | .............................. |
| .................... | ............ | ............ | .............................. |
| .................... | ............ | ............ | .............................. |

5. සමත්වී ඇති උසස්ම විභාගය :

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

6. පළපුරුද්ද :

(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න)

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දින ......සිට ......දක්වා | අස්වීමට හේතුව |
|---|---|---|---|
| .................... | .................... | .................... | .................... |
| .................... | .................... | .................... | .................... |
| .................... | .................... | .................... | .................... |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවෙන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :

(1) :————.

(2) :————.

(3) :————.

8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ තනතුරු :

(1) :————.

(2) :————.

(3) :————.

9. වෙනත් විස්තර :————.

10. මෙම අයදුම්පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළි වුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත් පත්වීම ලද පසු වරදක් හෙළි වුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–865—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මෙම සංස්ථාවේ පහත සඳහන් වන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ :—

**අභ්‍යාසලාභී අධිකාරි :**

**වැටුප් ක්‍රමය.**—රු. 500 මසකට (සියලු දීමනා ඇතුළුව).

**වයස් සීමාව.**—1970.1.15 දිනට අවුරුදු 22-30 දක්වා.

**අධ්‍යාපනික, කාර්මික සහ වෙනත් සුදුසුකම් සහ පළපුරුද්ද.**—පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යා හෝ ඉංජිනේරු උපාධියක් ලබා තිබීම ; හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සහතික පත්‍රයක් සහ ලන්ඩනයේ මුද්‍රණ විද්‍යාලයේ මුද්‍රණ පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරනු ලබන ඊට සමාන සහතික පත්‍රයක් ලබා තිබීම.

**ස්ත්‍රී පුරුෂභාවය.**—පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැක.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ ලේකම්තැනගෙන් ලබාගත හැකි ෆෝර්මවල පිළියෙල කළ ඉල්ලුම් පත් කොළඹ 5, 2බී, ද ෆොන්සේකා පාරේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති වෙත 1970 ජනවාරි 31 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

අයදුම් පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයෙන් පුද්ගලිකවද, 9" × 4" ප්‍රමාණයේ තම ලිපිනය සඳහන් මුද්දර ගැසූ ලියුම් කවරයක් ලේකම්තැන වෙත එවීමෙන්ද අයදුම් පත් ලබාගත හැක.

අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

2බී, ද ෆොන්සේකා පාර,
කොළඹ 5, 1970.1.13.

1–966—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා 1970 අප්‍රේල් මස පැවැත්වෙන අර්ධ වාර්ෂික විභාගය**

1970 අප්‍රේල් මස 4 සහ 5 දිනයන්හි මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික විභාගය පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

1970 අප්‍රේල් 5 { රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි සහ පාලන නීති සංග්‍රහය ;<br>ආරෝග්‍යශාලා හා බෙහෙත් හල් පරිපාලනය හා ගණන් පත්‍රය.

2. සිංහල/දෙමළ වාචික පරීක්ෂණය 1970 අප්‍රේල් 4 වෙනි දින පවත්වනු ලැබේ.

3. මෙම විභාගයට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත් විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන්ගෙන් ලබාගත හැකි ආකෘති ප්‍රකාර විය යුතුයි.

4. මෙම විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසින්ය. ඔහු විසින් මෙම විභාගය පවත්වනු සඳහා පනවනු ලබන නීති රීති සම්බන්ධයෙන් ආධුනිකයින් යටත් විය යුතුයි.

5. ඉල්ලුම්පත් තම විමධ්‍යගත කොට්ඨාශය භාර ප්‍රධානීන් මඟින් කොළඹ, මැලේ වීදියේ, විභාග කොමසාරිස්තුමා වෙත 1970.2.18 දිනට මත්තෙන් යැවිය යුතුය. විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් විසින් එම ඉල්ලුම්පත් 1970.2.18 වන දිනට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් තුමා වෙත ලැබීමට සලස්වනු පිණිස 1970.2.15 වන දිනට ප්‍රථමයෙන් සෑම ආධුනිකයෙකු විසින්ම ඔවුන්ගේ ඉල්ලුම්පත් අදාල විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් වෙත යැවිය යුතු බව දැන ගත යුතුය.

6. 1970.2.15 වෙනි දිනට පසු ලැබෙන සෑම ඉල්ලුම් පතක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

වී. පී. ඒ. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජනවාරි මස 10 වන දා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

1–773—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## පොලිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, කොටුවේ නව ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි, පොලිස් ගුවන් විදුලි පාලන මැදිරියේ ඒරියල් කණුව අලුත්වැඩියා කිරීම සඳහා සහ මන්නාරම, හලාවත සහ ගාල්ල යන පළාත්වල පොලිස් ස්ථානයන්හි ඒරියල් කණු සපයා සවිකිරීම සඳහා කොළඹ 1, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට පොලිස් ප්‍රවාහණ පිළිබඳ පොලිස් අධිකාරිගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක රු. 25 ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත් ලදුපතක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ පිළිබඳ පොලිස් අධිකාරිගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම 1970.2.18 දින දවල් 12 වන තෙක් ලබාගත හැක.

3. පොලිස් ප්‍රවාහණ භාර පොලිස් අධිකාරිගෙන් එසේ ලබා ගන්නා ලද පෝරමවල ඔබේ ටෙන්ඩරපත පිටපතකින් යුතුව ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 1, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති වෙත 1970.2.19 දින පෙරවරු 10 ට පෙර ලැබෙන සේ යැවිය යුතුයි. නොඑසේ නම්, ඔබේ ටෙන්ඩරපත් නියමිත දිනට හා වේලාවට පෙර පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැත්නම් පොලිස් මූලස්ථානයේ, පොලිස් අධිකාරි වෙත නියමිත දිනට හා වේලාවට පෙර ඔබම භාර දී, ඒ සඳහා ලැබුණු බවට ලදුපතක් ලබා ගන්න.

4. පොලිස් මූලස්ථානයේදී 1970.2.19 දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට එහි සිටීමට අවසර දෙනු ලැබේ.

5. වැඩිදුර විස්තර කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ භාර පොලිස් අධිකාරිගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ජී. ජයසිංහ,
පොලිස් අධිකාරි, ප්‍රවාහණ.

1970 ජනවාරි මස 9 වෙනි දින,
කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ
කාර්යාලයේ දී ය.

1–736—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය—නගර හා ගෘහ නිර්මාණ අංශය

### කතරගම සැලසුම් යෝජනා ක්‍රමය—පූජා භාණ්ඩ වෙළඳ සැල්

කතරගම පූජා භාණ්ඩ වෙළඳ සැල් පේළි දෙකක් ඉදිකිරීම සඳහා කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1970 පෙබරවාරි මස 8 වැනි දින පෙරවරු 10 දක්වා, පිටපත් දෙකකින් යුත්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ. එදිනම නගර හා ග්‍රාම නිර්මාණ අංශයේදී පෙරවරු 10.15ට ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල විය යුතුය. ර. 1,50,000කට නොඅඩු වැඩ සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචිවී සිටින අයට එසේ ලියාපදිංචිවීම පිළිබඳව සතුටුදායක සාක්ෂි සහ ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 කොළඹ 1, "හේමාස්" ගොඩනැගිල්ලේ පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ කොළඹින් පිටත තිබෙන ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කරන අයට 1970 පෙබරවාරි මස 7 වන දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනවා ඇත.

3. ඉහත සඳහන් 2 ඡේදයේ දක්වා ඇති මුදලට ඕනෑම රජයේ දෙපාතීමේන්තුවක ලියාපදිංචි වී ඇත්නම් අනුමතින සමිති සමාගම් වලටද ටෙන්ඩර් කළ හැක. එබඳු සමිති සමාගම් ටෙන්ඩර් තැන්පත් මුදලෙන් නිදහස් ය.

4. සියලුම ටෙන්ඩර් සීල් තබා කවරයෙහි වම් පැත්තේ මුදුන් කෙළවරෙහි "කතරගම පූජා භාණ්ඩ වෙළඳ සැල්" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. එසෙත් නැතහොත් නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ කාර්යාල සහකාර තැනට භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුය.

ඇන්. ගුණරත්න,
නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ.

නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, 1970 ජනවාරි මස 11 දින.

1–853—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

ත්‍රිපොලි වෙළඳ හලේ පිහිටි එළුමස්/ගවමස් කඩපිල්, 1970.12.31 දක්වා එළුමස් හා ගවමස් විකිණීම පිණිස බදුදීම සඳහා කොළඹ 1, චැතැම් විදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1970.2.15 දින අ. භා. 2.30 දක්වා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළවිට, 1970.2.15 දින දවල් 12 දක්වා ඉල්ලුම් පත් ලබාගත හැක. ඉල්ලුම් පත් අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ ත්‍රිපොලියේ සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ දැනගත හැක.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.1.13 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

1–839—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහන අංශයේ ඇති පාවිච්චි කළ, ලොරි සහ කාරයක් ඇතුළු මෝටර් වාහන 10 ක් මිළ දී ඉවත් කරගෙන යාම සඳහා කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 15 වෙනි ඉරිදා අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ 1, චැතැම් විදියේ අංක 62 දරන තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1970 පෙබරවාරි මස 15 වැනි ඉරිදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහන අංශයෙන් දැන ගැනීමට පුළුවන.

පී. ජී. ජී. ධර්මසිරි,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 1. 13 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

1–840—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1970. 6. 30න් අවසන් වන කාලය තුළ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ මුළුතැන්ගෙයි හා බේකරියේ එකතු වන සත්වාහාර සඳහා සුදුසු ද්‍රව්‍ය මිලදී ඉවත් කරගෙන යාම සඳහා මිල ගණන් කොළඹ 1, වෙතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 15 වන දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

මිල ගණන් පෝරම 1970 පෙබරවාරි මස 15 වන දින දවල් 12 දක්වා කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 1. 13 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

1–841—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පරන්තන් රජයේ ගොවිපලට විවෘත පූච්චූ මඩු සෑදීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පරන්තන් රජයේ ගොවිපලට විවෘත පූච්චූ මඩු සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970. 2. 16 වැනි දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

ටැන්ඩර තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැබූ බවට කුවිතාන්සියක් යාපනයේ කෘෂිකර්ම (ගො. පා. හා. නි.) කායඝාලයේ, කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනට පෙර දින, දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර ආකෘති පත්‍ර ලබා ගැනීමට හැකිවේ. මෙම තැන්පත් මුදල කැමති කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ කොළඹ, ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවෙහි අධ්‍යක්ෂගේ ගිණුම් අංකය 37 ට බැරකිරීමෙන් හෝ තැන්පත් කළ හැකිය. මෙම තැන්පත් මුදල් බැංකුවට ගෙවීමේ දී පවා මුදල් බැඳීමේ තුණ්ඩුව රජයේ කායඝාලවල පාවිච්චි කරනු ලබන ආකෘති පත්‍රවල (ආකෘති පත්‍ර පොදු 118) පිළියෙල කළ යුතුවේ. අවශ්‍ය ආකෘති පත්‍රය බැංකුවෙන් ලබාගත හැකිය.

වැඩි විස්තර සඳහා මෙම ගැසට් පතේ පළවී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේ දීය,
1970.1.8 වැනි දින.

1–617—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ ජලනල මධ්‍යස්ථානයට වතුර පොම්ප සැපයීම සහ ස්ථාපනය කිරීම

අංක 14,884 හා 1969. 12. 12 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1969. 11. 27 වැනි දින දරණ ටෙන්ඩර් දැන්වීම පිළිබඳවයි.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1970.2.9 වෙනි දින ප. ව. 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම ඉංජිනේරු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය,
1970. 1. 8.

1–603—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් උපකරණ සැපයීම සඳහා 69.12.12 වෙනි දින අංක 14,884 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද දැන්වීම අයුරු කැඳවන ලද ටෙන්ඩර් භාර ගැනීමේ දිනය 1970 පෙබරවාරි මස 1 වෙනි දින පස්වරු 2.30 තෙක් මෙයින් දීර්ඝ කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම 70.1.28 වෙනි දින පස්වරු 2.30 තෙක් කරණු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සේවය | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| ඇම්.ටී. 697001 ... | ක්‍රෝලර් ට්‍රැක්ටර් 1 යි | ... | 100 | 0 |
| ඇම්.ටී. 697021 ... | අහල් 2 පොම්ප 7 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697002 ... | නැප්සැක්ලෝ වොලියුම් ස්ප්‍රේයර් 40 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697005 ... | ට්‍රැක්ටර් ට්‍රේයිලර් 15 යි | ... | 100 | 0 |
| ඇම්.ටී. 697003 ... | බූම් ස්ප්‍රේසර් 3 යි ... | ... | 25 | 0 |
| ඇම්.ටී. 697006 ... | හැන්ඩ් විනෝවර් 3 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697007 ... | ගයිරෝ මූවර් 2 යි ... | ... | 25 | 0 |
| ඇම්.ටී. 697014 ... | මෝටර් සයිකල් 37 යි | ... | 100 | 0 |
| ඇම්.ටී. 697010 ... | එයාර් කොම්ප්‍රෙෂර් 5 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697011 ... | වැල්ඩින් යුනිට් 5 යි ... | ... | 25 | 0 |
| ඇම්.ටී. 697012 ... | පෝර්ටබල් ලුබ්රිකේටර් 5 යි | ... | 25 | 0 |

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

70.1.8 වෙනි දින,
පෙරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේදීය.

1–764—70.1.23 දින අංක 4,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ ගොවිපලේ 1969–70 මහකන්නයේ ගොයම් කැපීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලේ පහත දැක්වෙන කොටස්වල ගොයම් කැපීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 පෙබරවාරි මස 16 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

එම ගොවිපලේ ඒ ඒ කොටස්වල ගොයම් කැපීම පහත සඳහන් දිනයන්හිදී පටන් ගත යුතුයි :—

| කුඹුරු කොටස් අංකය | කැපීමට ඇති අක්කර ප්‍රමාණය | කැපීම ආරම්භ කළ යුතු දිනය | දිනකට කැපිය යුතු අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| ඒ ... | 70 ... | 1970.2.21 ... | 10 |
| බී ... | 50 ... | 1970.2.28 ... | 10 |
| සී ... | 95 ... | 1970.3. 5 ... | 10 |
| ඩී ... | 82 ... | 1970.3.14 ... | 10 |
| ඊ ... | 52 ... | 1970.3.22 ... | 10 |

2. මෙහි එක එක කොටස් සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉල්ලිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් එක කොටසකට වැඩි ගණනක් සඳහා ටෙන්ඩර් ඉල්ලීමට පුළුවන. ඒ සඳහා වෙන වෙනම ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර්කරු විසින් ගන්නා ලද අක්කර ප්‍රමාණය කිසියම් හේතුවක් ඇතොත් එහි අක්කර ප්‍රමාණය අඩු කිරීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. ගොයම් කපන දැකැති ආදිය ටෙන්ඩර්කරු විසින් සපයා ගත යුතුයි.

3. ඉහත සඳහන් ගොවිපලේ කපන ලද ගොයම් කපන ස්ථානයේ සිට යාර 150 ක් පමණ ඈතින් වූ ස්ථානයකට ගෙන ගොස් කළමනාකරුගේ උපදෙස් අනුව ගොඩගැසිය යුතුයි. මෙය වී වැටෙන්නට නොදී කළ යුතුය. අඟල් 6 කට වැඩිය ඉපනැල්ලක් කුඹුරේ නොතිබිය යුතුයි. ගොයම් කැපීමෙන් පසු කොළ ගැනීමේදී වැටුනු ගොයම් කරල් හෝ උප්පිඩි යනාදිය හොඳින් අහුලා ගොඩගසා කොළයට එක් කළ යුතුය.

4. අනුරාධපුර ගොවිපල පාලන හා නිශ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙපිටපතකින් යුක්තව නිසිසේ සම්පූර්ණ කර සීල් තබා " සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය,

කෘෂිකර්ම අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය '' යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරේ '' ගිහුරක්ගොඩ ගොවිපලේ ගොයම් කැපීම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යන්න ලියා එවිය යුතුයි. ඉල්ලුම් කරුගේ ලිපිනයද එහි සඳහන් කළ යුතුයි.

5. 1970 පෙබරවාරි 15 වැනි දින ප. ව. 4 තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක් බැගින් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැකිය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින හතක් ඇතුළත දී අවශ්‍ය ඇප තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරණවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර ඇරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නම් ලැයිස්තුවට ද ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

6. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ඒවා අත්තිම භාරදිය යුතුයි. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුය.

7. ටෙන්ඩර්කරුට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත් වීමට නියමිත ඉහත කී දින, එකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

8. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන් තැබිය යුතු වේ.

9. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූ, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක් (5%) ඇප මුදලක් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූවාට පසු පමණි. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල, රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තු වට ඇතුළත් වෙනවාද ඇත.

11. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

12. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති එකොලහකටවත් වෙනස් නොවන ඒවා විය යුතුය.

13. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේම අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තු වට තනි කනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග නම ඇතුළත් වූ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනී යන හේතු පිට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නොපුහුණු දෙවර්ගයේ ම ලාංකික කම්කරුවන් පමණක් තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට ටෙන්ඩර්කරු යම්කිසි විදියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරී විසින් අනුමත කරණ ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට ටෙන්ඩර්කරුට බලය දිය හැකිය. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ. '' ලාංකික '' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි. කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකම සාධාරණ වූ ද, කම්කරු වේතන ගෙවීම සම්බන්ධ යෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට තෝරාගත් ටෙන්ඩර්කරු එකඟ විය යුතුයි. කොන්ත්‍රාත්තුවේ වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරු වන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, වැක්රෝල්පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරි යෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට තෝරාගත් ටෙන්ඩර්කරු බැඳී සිටිය යුතුයි.

17. 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (අධිකාරය 117) යටතේ සේවකයෙකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන් ත්‍රාත්කරු වග බලා ගත යුතුය.

18. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්වා කුවිතාන්සි එවන අයට ඒ දිනයේදීම ටෙන්ඩර් ආකෘති පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවනු ලැබේ. එහෙත් ඒවා කලට වේලාවට ඔවුන්ට නොලැබුනහොත් ඒ ගැන වග කියනු නොලැබේ.

19. මේ පිළිබඳ වැඩි විස්තර එම ගොවිපලේ කළමනාකරුගෙන් ලබා ගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල්).

1970 ජනවාරි මස 8 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
කෘෂිකර්ම, අධ්‍යාපන හා ගොවිපල් කාර්යාලයේ දී ය.

1–616—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටැන්ඩර්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශීය නියෝජිතවරුන්ගෙන් ටැන්ඩර් 1970 පෙබරවාරි මස 24 වෙනි දින ප.ව. 2.30 වන තෙක් භාර ගනු ලැබේ.

| ටැන්ඩර් අංකය | | සේවය | | ටැන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඇම්.ටී. 697024 | ... | ස්ලයිඩ් ප්‍රොජෙක්ටර්—20 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697025 | ... | ජෙනරේටර් 5 යි ... | ... | 25 | 0 |
| ඇම්. ටී. 697026 | ... | ප්‍රොජෙක්ටර් 16 මිලි මීටර් 5 යි | ... | 25 | 0 |
| ඇම්.ටී. 697027 | ... | ටේප් රෙකෝඩර් 2 යි | ... | 25 | 0 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටැන්ඩර් පිටපත් තුනකින් එවිය යුතු අතර සෑම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතුයි. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි '' 1970 පෙබරවාරි 24 වෙනි දින වසනු ලබන ටෙන්ඩර් සඳහා අංක ඇම්.ටී. 6970........ '' යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටැන්ඩර් පෝර්ම 1970 පෙබරවාරි 23 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන්පසුව ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ, යෝක් විදි ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ එක් එක් ටැන්ඩරය සඳහා ඉහත සඳහන් ටැන්ඩර් තැන්පත් මුදල බැරකළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත් හැකිවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජනවාරි මස 13 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දීය.

1–838/1—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශීය නියෝජිතවරුන්ගෙන් ටැන්ඩර් 1970 පෙබරවාරි මස 24 වෙනි දින ප.ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| ටැන්ඩර් අංකය | සේවය | ටැන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|
| ඇ.මි.ටී. 697028 | ... ඩිස්ප්ලවුස් 20 ... | ... 25 0 |
| ඇ.මි.ටී. 697029 | ... වයින් විලර් 20 ... | ... 25 0 |
| ඇ.මි.ටී. 697030 | ... ඩක් පුට් කල්ටිවේටර් 20 | ... 25 0 |
| ඇ.මි.ටී. 697031 | ... රිජස් 10 ... | ... 25 0 |
| ඇ.මි.ටී. 697032 | ... සීඩ් ඩ්‍රිල්ස් 5 ... | ... 25 0 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටැන්ඩර් පිටපත් තුනකින් එවිය යුතු අතර සෑම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතුයි. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි " 70.2.24 වැනි දින වසනු ලබන——————සඳහා ටැන්ඩර් අංක ඇ.මි.ටී. 6970—— " යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටැන්ඩර් පෝර්ම 1970 පෙබරවාරි 23 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන්පසුව ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ ලංකා බැංකුවේ, යෝක් වීදි ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ එක් එක් ටැන්ඩරය සඳහා ඉහත සඳහන් ටැන්ඩර් තැන්පත් මුදල බැර කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකි වේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජනවාරි මස 13 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දීය.

1–838/2—1970.1.23 දි අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශික නියෝජිතවරුන්ගෙන් ටෙන්ඩර් 1970 පෙබරවාරි මස 23 වෙනි දින ප. ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| ඇ.මි. ටී. 697016 | ... ස්ටේෂන් වැගන්ස් 4 යි ... | 100 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබා ගත හැකි ආකෘති පත්‍ර මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

3. ටෙන්ඩර් පිටපත් තුනකින් එවිය යුතු අතර සෑම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතු අතර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරේ 70.2.23 වැනි දින වසනු ලබන " ස්ටේෂන් වැගන්ස් සඳහා ටෙන්ඩර් අංක ඇ.මි. ටී./697016 " යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම 70.2.22 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන්පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ යෝක් වීදි ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල බැරකළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබා ගත හැකිවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

70.1.8 වෙනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දී ය.

1–780—1970.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවලට ඉරු දෙකේ පොල් අතු සහ වල් අඹ ඇට සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීමයි

ඉහත සඳහන් දේ සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 පෙබරවාරි මස 8 වෙනි දින පෙ. ව. 10 දක්වා යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) විසින් භාරගනු ලැබේ.

(අ) කරදියන් ආරු රජයේ ගොවිපලට (මඩකලපුව දිස්ත්‍රික්කය) ඉරු දෙකේ පොල් අතු 6,000ක් සැපයීම හා ගෙනවිත් භාරදීම.

සෑම පොල් අත්තක්ම අඩි 6කට වඩා දිගින් ද, අඟල් 13කට වඩා පළලින් ද තිබිය යුතුයි. සැපයීම හා ගෙනවිත් භාරදීම 1970.2.15 වෙනි දිනට හෝ ඊට පෙර නිමකළ යුතුයි. අවශ්‍ය වන නියමිත දිනය ගොවිපල කළමනාකරු විසින් දන්වනු ඇත. පොල් අතු 100කට අය කරන මිළ ගණන් දැක්විය යුතුයි.

(ආ) වවුනියා ගොවිපලට කෘමීන්ගෙන් හානි නොවූ වල් අඹ ඇට 10,000ක් සැපයීම හා ගෙනවිත් භාරදීම.

වල් අඹ ඇට සැපයීම හා ගෙනවිත් භාරදීම කොටස් දෙකකින් යුතුව කළ යුතු අතර, එක් වරකට අඹ ඇට 5,000ක් සැපයිය යුතුයි. වල් අඹ ඇට සැපයීම හා ගෙනවිත් භාරදීම 1970. 2 15 වෙනි දිනට හෝ ඊට පෙර නිමකළ යුතුයි. අඹ ඇට වලට පමණක් ගෙවනු ලැබේ. අඹ ඇට සියයකට අයකරන මිල ගණන් දැක්විය යුතුයි.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) ....................................සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කාර්යාලයේ (ගො. පා. හා නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචිකළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර් කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර්කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර්

තැන්පත් මුදල රජසන්තක වනවාත් හැර, ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම් වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන් වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) තැනගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසි වලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිල ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියලුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළයුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන් කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුළු වටිනාකමින් සියේට 5ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුව හොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

12. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාර ගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයාට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සළකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සෑහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. වී. ජිනෝන් ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේදීය,
70. 1. 11.

1–754—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල පහත සඳහන් නි. මි. යෝ.ක්‍රා. ගබඩා ඉදි කිරීම සඳහා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින්ද ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | | ස්ථානය | | ගොඩනැගිලි ගණන |
|---|---|---|---|---|
| මඩකලපුව | ... | වව්නතිව් | ... | එකයි (1) |
| ත්‍රිකුණාමලය | ... | පාන්කුලම් | ... | එකයි (1) |

2. රු. 250 ක් (රුපියල් දෙසිය පණහක්) තැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක. මෙම ඇප එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් වෙන වෙනම තැන්පත් කළ යුතුය.

3. රු. 30,000 කට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි මස 18 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන අය විසින් ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන දින නියමිත වේලාවට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. කී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
අංක 42 දරන ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

1–804—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

පහත සඳහන් නි. මි. යෝ. ක්‍රා. ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 7 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින් දා ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | | ගබඩාව |
|---|---|---|
| කොළඹ | ... | සන්තබස්තියම |
| කළුතර | .. | ආහාර ගබඩාව |

2. රු. 50 ක් "රුපියල් පණහක්" තැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක. 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍ර වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7 හෝර්ටන් පෙදෙසේ, අංක 60, දරණ ස්ථානයේ ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක. මෙම ඇප එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් වෙන වෙනම තැන්පත් කළ යුතුය.

3. රු. 30,000 කට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි මස 18 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන අය විසින් ටෙන්ඩර භාර ගැනීම අවසන්වන දිනය නියමිත වේලාවට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු, මාවතේ අංක. 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

1–855—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### වී වේලන සිමෙන්ති බිමක් තැනීම සඳහා ටැන්ඩර්

රජයේ සහල් මෝල්වල වී වේලන සිමෙන්ති බිම් සකස් කිරීම සඳහා පහත සඳහන් ස්ථානයන් සඳහා ටෙන්ඩර් පත් 1970 පෙබරවාරි 13 වැනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත (එඩිංබරෝ චන්ද්‍රවංකය) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| | දිස්ත්‍රික්කය | | ස්ථානය | | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | අනුරාධපුර | ... | පදවිය ර. ස. මෝල | ... | 1 |
| 2. | මාතලේ | ... | කන්දලම ර. ස. මෝල | ... | 1 |
| 3. | පොළොන්නරුව | ... | බකමූණ ර. ස. මෝල | ... | 1 |
| 4. | මොණරාගල | ... | මොණරාගල ර. ස. මෝල | ... | 1 |
| 5. | මහනුවර | ... | පල්ලෙවත්ත ර. ස. මෝල | ... | 1 |

2. ඒ සඳහා රුපියල් 50 ක් එක් ස්ථානයක් වෙනුවෙන් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ (එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක. එක් ටෙන්ඩර් කරුවෙකුට ඉහත සඳහන් එක වැඩකට හෝ වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. රු. 10,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත් කරුවන්ට පමණක් "කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි 13 වැනි දින දවල් 12.00 වනතෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන්ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුයි.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත (එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 ජනවාරි 23 වැනි දා,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
(එඩිංබරෝ චන්ද්‍රවංකයේ) අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

1–610—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කායාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### වැඩ ලැයිස්තුව

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | තලටුව වැව | ... | පැන්නුම බැඳීම | ... | වැ.වි.හ.ප. |
| 2. | තලටුඅංග වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 3. | පනාගමුව වැව | ... | එම | ... | එම |
| 4. | අළුත් වැව | ... | එම | ... | එම |
| 5. | හැවන්දන කුඹුර අමුණ | ... | පැන්නුම බැඳීම | ... | එම |
| 6. | රත්මල්ගොඩ අමුණ | ... | අළුත්වැඩියා කිරීම | ... | එම |
| 7. | අඹගහමුල අමුණ | ... | එම | ... | එම |
| 8. | මාකලේපොල අමුණ | ... | එම | ... | එම |
| 9. | කන්දැති කුඹුර අමුණ | ... | එම | ... | එම |
| 10. | උඩකුඹුරේ අමුණ | ... | අමුණු බැඳීම | ... | එම |
| 11. | පල්ලියේවත්ත වැව | ... | හොරොව්ව අළුත්වැඩියා කිරීම | | එම |
| 12. | කටුකණු අමුණ | ... | අමුණ බැඳීම | ... | ද.දෙ.හ.ප. |
| 13. | නාඩාවාරි අමුණ | ... | එම | ... | එම |
| 14. | පුවක්වැටියේ අමුණ | ... | අළුත්වැඩියා කිරීම | ... | එම |
| 15. | බෝගහඇල අමුණ | ... | එම | ... | එම |
| 16. | ගම්මනේ කුඹුර | ... | වාරිමාර්ග පහසුකම් | ... | එම |
| 17. | කොළඹලාමුල්ල අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 18. | ගුරු වැව | ... | දියුණු කිරීම | ... | ක.හ.ප. |
| 19. | අමුණුපිටියේ වැව | ... | එම | ... | එම |
| 20. | වීරකොඩියාන බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 21. | වීරකොඩියාන වැව | ... | දියුණු කිරීම | ... | ක.හ.ප. |
| 22. | ගෝන ඇල | ... | බැම්ම බැඳීම | ... | එම |
| 23. | තුන්මෝදර වැව | ... | හොරොව්ව බැඳීම | ... | එම |
| 24. | නාගහබැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 25. | කොටුවැව | ... | අමුණ බැඳීම | ... | එම |
| 26. | මාවෙල බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 27. | හුන්ගාවෙල බැම්ම | ... | එම | ... | එම |
| 28. | මහවාන බැම්ම | ... | එම | ... | එම |
| 29. | ඉරබඩගම ඇල | ... | රෙගුලේටරය සෑදීම | ... | එම |
| 30. | පොතුපිටිය වැව | ... | දියුණු කිරීම | ... | දෙ.මැ.හ.ප. |
| 31. | මැදගම වැව | ... | එම | ... | එම |
| 32. | මයිලගහ අමුණ | ... | අළුත්වැඩියා කිරීම | ... | එම |
| 33. | තෙලහැර මහ වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 34. | ගලටබැඳි වැව | ... | එම | ... | එම |
| 35. | බෙලිවැව මහ වැව | ... | එම | ... | එම |
| 36. | කිතගම වැව | ... | එම | ... | එම |
| 37. | ආරච්චිගම වැව | ... | එම | ... | එම |
| 38. | කනාගේ ඇලේ කනු කැටේ බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 39. | බෝගොඩ මහ වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 40. | අමුණුතුඩුවේ අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 41. | බොරළුවේ අමුණ | ... | එම | ... | එම |
| 42. | දිග්ගලගෙදර මහවැව | ... | ප්‍රතිසංස්කරණ කිරීම | ... | එම |
| 43. | වඳුරුස්ස මහ වැව | ... | එම | ... | එම |
| 44. | කෙමන්වැටියේ බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 45. | රත්මලේ වැව | ... | ප්‍රතිසංස්කරණ කිරීම | ... | එම |
| 46. | දුනුපොතරඹේ වැව | ... | එම | ... | එම |
| 47. | පොහොරවත්ත වැව | ... | එම | ... | හි.හ.ප. |
| 48. | බඩල්වැව | ... | එම | ... | එම |
| 49. | පහලවෙල අමුණ | ... | සුලුසුව සෑදීම | ... | එම |
| 50. | ගල්ලැහැවෙල අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 51. | මාළුළිය වැව | ... | ප්‍රතිසංස්කරණ කිරීම | ... | හි හ.ප. |
| 52. | දිවුල්ගනේ වැව | ... | එම | ... | ව.හ.ප. |
| 53. | කප්පරවල්ලිය වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 54. | වදුරුස්ස මහ වැව | ... | එම | ... | එම |
| 55. | සමගිය වැව | ... | එම | ... | එම |
| 56. | මොරගොල්ල මහ වැව | ... | එම | ... | එම |
| 57. | පහලගම වැව | ... | අළුත්වැඩියා කිරීම | ... | එම |
| 58. | සියඹලාගස්වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 59. | හිතෝකඩවල වැව | ... | කඩබැඳීම | ... | එම |
| 60. | පහළවැටිය වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 61. | තෙල්නයිදාගම වැව | ... | එම | ... | එම |
| 62. | පාළුඅළුත්ගම වැව | ... | එම | ... | එම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970.2.23 වන දින දවල් 12 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කායඝාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන්කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින්ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක් ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "............සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර 1970.2.24 වන දින පෙ.ව. 10 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කායඝාලයේ තබා ඇති " ටෙන්ඩර් පෙට්ටියට " දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත්වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කායඝාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකා වල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කායඝාලීය වේලාවන් තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවර ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියෙකු විසින් 1970 පෙබරවාරි මස 24 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන සිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එස්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කායඝාලය,
1970.1.9 දින දීය.

1—674—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙමම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### උඩගේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශය

1. කැටයාපතන අමුණුකුරේ ඇළ ප්‍රතිසංස්කරණය.
2. පල්ලේවෙල පොල්ගහයට කඳුර අමුණ බැඳීම.
3. හඟුරන්කෙත පල්ලෙමලුව ඇළ ප්‍රතිසංස්කරණය.
4. මකුරුප්ප වැල්කින ඇළ ප්‍රතිසංස්කරණය.
5. ලියන්වෙල උඩබින්තර අමුණ බැඳීම.
6. හඟුරන්කෙත පිල්ලෙඅරාව ඇළ ප්‍රතිසංස්කරණය.
7. හපුවල අරත්තන අමුණ බැඳීම.
8. මල්උල්ල කොහොඹගානෙ ඇළ ප්‍රතිසංස්කරණය.
9. උඩවත්ත තොටුපල ඇළ ප්‍රතිසංස්කරණය.
10. හපුවල හටහල්ගම ඇළ ප්‍රතිසංස්කරණය.
11. බඹරගම හුරීඇල්ල ඇළ ප්‍රතිසංස්කරණය.
12. මාකෙම්පේ මීඅඹයා ඇළ ප්‍රතිසංස්කරණය.

### වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය

13. කුඹල්ගමුව ඇල්වත්ත ඇළ ප්‍රතිසංස්කරණය.
14. කැටකඳුර කෝවිල්ලන්ද ඇළ ප්‍රතිසංස්කරණය.
15. කුඹල්ගමුව අලුත් ඇළ ප්‍රතිසංස්කරණය.
16. කැටකඳුර උණගොල්ල ඇළ ප්‍රතිසංස්කරණය.
17. නිබ්බටුගොඩ හාල්මී ඇළ ප්‍රතිසංස්කරණය.
18. යටිමාදුර යමුණ ඇළ ප්‍රතිසංස්කරණය.
19. යටිමාදුර ගල්කැටිය ඇළ ප්‍රතිසංස්කරණය.
20. රූපහ ගල්කොටුවෙ ඇළ ප්‍රතිසංස්කරණය.
21. කුරුපනාවෙල හිඹිලියගස්තැන්න ඇළ ප්‍රතිසංස්කරණය.
22. රූපහ පොල්වත්ත කඳුර ඇළ ප්‍රතිසංස්කරණය.
23. කුඹුක්වෙල උඩගම පල්ලේ ඇළ ප්‍රතිසංස්කරණය.
24. කුඹුක්වෙල කුඹුක්වෙල ඇළ ප්‍රතිසංස්කරණය.
25. කුරුපනාවෙල විඩුඇළ ප්‍රතිසංස්කරණය.
26. මාලියද්ද උඩාරාව ඇළ ප්‍රතිසංස්කරණය.
27. රූපහ ගෝනපැලැල්ල ඇළ ප්‍රතිසංස්කරණය.

### කොත්මලේ ප්‍රා.ආ.නි. කොට්ඨාශය

28. පනන්ගම්මන අමුහේන ඇළ ප්‍රතිසංස්කරණය.
29. පනන්ගම්මන නෙලුවෙමංකඩ ඇළ ප්‍රතිසංස්කරණය.
30. දුනුකේදෙනිය උගුල්ඇටියා ඇළ ප්‍රතිසංස්කරණය.

31. සංගිලිපාලම උඩුවක්වේල ඇළ ප්‍රතිසංස්කරණය.
32. කුඹල්ඔලුව මැදගම ඇළ ප්‍රතිසංස්කරණය.
33. රාවණාගොඩ කොන්ඩපොළ ඇළ ප්‍රතිසංස්කරණය.
34. කුඹල්ඔලුව පහළකුරුවෙන්තොට ඇළ ප්‍රතිසංස්කරණය.
35. මැතගම උඩමාකඳුර ඇළ ප්‍රතිසංස්කරණය.
36. කඩදෙරපිටිය මහගලගාව ඇළ ප්‍රතිසංස්කරණය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 පෙබරවාරි මස 11 දින දවල් 12 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත්කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "................. සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 පෙබරවාරි මස 12 වෙනි දින දවල් 12 ට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5 % ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 පෙබරවාරි මස 15 වෙනි දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇස්. ඕ. එච්. සුපියරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ
කාර්යාලය,
1970 ජනවාරි මස 13 දින දීය.

1–858—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### දිය බැස්සවීම හා වගුරුබිම් සංවර්ධනය උදෙසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සැපයීම

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1970, අප්‍රියෙල් මස විසිහය වන රිවිදින පෙර වරු 10 වනතෙක් දිය බැස්සවීම හා වගුරුබිම් සංවර්ධනය උදෙසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ, බුලර්ස් පාරේ, පිහිටි වාරිමාර්ග අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් අයදුම්පත් අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 250 ක් කොළඹ, බුලර්ස් පාරේ වාරිමාර්ග අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ලබාගෙන ඉදිරිපත් කලවිට වර්ෂ 1970 අප්‍රියෙල් මස විසිතුන් වන ගුරු දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 7, බුලර්ස් පාරේ, වාරිමාර්ග අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක.

එල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 7.
1970 ජනවාරි මස 13 දින දීය.

1–861—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 පෙබරවාරි මස 27 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල රු. |
|---|---|
| 1. වියලුව ප්‍රා. ආ. නි. කොටසේ බුදුගේ කන්ද-කොහාන පාර-1 වන සැතපුම තැනීම (බෝක්කු සහ පස් වැඩ) ... ... | 50,000 |
| 2. වියළුව ප්‍රා. ආ. නි. කොටසේ කැන්දකැටිය-කිවුලේගෙදර පාර සැතපුම් 1½ තැනීම. (පෙට්ටි බෝක්කු) ... ... | 25,000 |
| 3. මැදිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ ගල්කඩපතන පාර අඩි 2,700 තැනීම (පස්වැඩ සහ බෝක්කු) ... | 30,000 |
| 4. මැදිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ හල්දුම්මුල්ල වට ගමුව කට්ටිකරුවන්ට නල මඟින් ජලය සැපයීම ... | 20,000 |
| 5. යටිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ රොක්හිල් ජලනල ව්‍යාපාරය අළුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීම | 50,000 |
| 6. යටිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ හපුගහපතන-යෙල්වර්ටන් පාර, ගල් අතුරා තාර දමා වැඩිදියුණු කිරීම ... ... | 35,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි මස 20 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ල කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක් පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලුමුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 පෙබරවාරි මස 27 දින පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රජ සන්තක කරනු ලැබේ. ලියා පදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරනවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙව්වූ පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ල දිසාපතිගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල.
1970. 1. 8.

1–692—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

මරදාන දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ ඇති හිස් සිමෙන්ති මලු, ටයර් යනාදිය මිළයට ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් (ලිපිනය: දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්‍යාලය, තැ. පෙ. 355, කොළඹ 10.) 1970 පෙබරවාරි මස 23 වෙනි දින (සඳුදා) පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍යවුවහොත් ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාරගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වයේ ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10හි දුම්රිය ගබඩා අධිකාරී කාර්‍යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 1,000 ක් කොළඹ 10හි, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්‍යාලයෙහිදී හෝ කොළඹින් පිටත නම්, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල විට 1970 පෙබරවාරි මස 22 වෙනි ඉරිදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

5. 1970 පෙබරවාරි මස 23 වෙනි සඳුදා පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම්, මරදානේ දුම්රිය ගබඩා අධිකාරී කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

ඇම් සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

කොළඹ,
1970. 1. 12 දා,

1–750—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශයට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම 1970**

1969.12.12 වෙනි දිනැති අංක 14,884 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1969.11.25 වෙනි දිනැති මගේ ටෙන්ඩර් දැන්වීමට අමතර වශයෙනි. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1970.2.7 දින දක්වා දීර්ඝ කරන ලද බැව් දන්වනු ලැබේ.

ඒ. ජී. එච්. නාබෘ,
කළුතර, සෞ. සේ. අධිකාරී.

1970.1.6,
කළුතර, සෞඛ්‍ය සේවා අධිකාරියේ දීය.

1–611—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මානසික රෝහල, අංගොඩ—කිලිටි රෙදි ඇපිල්ලීම

**සේවය හා ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1970 මාර්තු 1 වන දින සිට 1970 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුල මෙහි පහත සඳහන් උපලේඛනයේ පලමුවන වගන්තියේ දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අංගොඩ මානසික රෝහල් අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—මෙම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් කරන ලද මුදල මා නමට කොළඹ කච්චේරියේ තැන්පත්කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධසේවා සංගම් වලට අයිති සමිතිද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා මෙවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචිකළ අංකය පැහැදිලි ලෙස සටහන් කළ යුතුයි.

3. **ටෙන්ඩර් පත්‍ර**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පලමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පලමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

4. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමට සෑහෙන කාලයකට ප්‍රථම තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම් මෙම කාර්යාලයෙන් ලබාගතහැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්ට ඉඩ තිබේ.

5. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දල වශයෙන් මසකට සේදිය යුතු කැලි ප්‍රමාණය මෙහි පහත සඳහන් උපලේඛනයේ 5 වන වගන්තියේ දක්වා ඇත.

6. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා මානසික රෝහල් අධිකාරී, අංගොඩ කියා එවිය යුතුයි සීල්තබා එවනු ලබන ටෙන්ඩර් පත් බහා එවනු ලබන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාව සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් තමාම ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් එය ලැබුන බවට කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

7. **ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත සඳහන් උපලේඛනයෙහි 6 වන තීරයේ දිනයේ පෙ.ව. 10 ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

8. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගනන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත-යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂාකළ හැක.

9. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පලමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉක්මවන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේනම් එහි සඳහන් මිල ගනන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි සඳහන් කොන්දේසි හොඳින් දැනගතයුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

12. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුව හොත් ඊට යන වියදම පලාතේ ආදායම් පාලක නිලධාරීතුමා තක්සේරු කළ ගණන්වලට අනුව කොන්ත්‍රාත්කරු දැරිය යුතුයි.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පලමු ඒවායේ විෂබීජ නැතිකිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පලාත් පාලන මණ්ඩල තුල ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන ඇති අයට පමණි.

(iv) ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල බැඳීමෙන් පසු ඉල්විය හැක.

ඇම්. ජී. ජයසුන්දර,
මානසික රෝහල් අධිකාරී.

මානසික රෝහල් අධිකාරී කාර්යාලය,
අංගොඩ, 1970.1.11.

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප තැන්පත් මුදල | මසකට තේරිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු සාමාන්‍ය කෑලි ගණන | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| මානසික රෝහල අංගොඩ—3 වෙනි අංශය.— | | | | | |
| ගැහැණු වාට්ටු අංක 21, 22, 23, 24, 25, 26, 27, 28 සහ 29 ... | රු. 100/ ... | රු. 500/ ... | 4 වරක් ... | 7,500 පමණ ... | 1970.2.15 පෙ.ව. 10 ට |
| මුල්ලේරියාව රෝහල අංක 1 ... ... | රු. 25/ ... | රු. 100/ ... | 4 වරක් ... | 3,500 පමණ ... | එම |

1–755—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 මාර්තු 1 වන ද සිට 1970 දෙසැම්බර් 31 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

**සැ.යු.**—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියාව සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවැනි ඡෙදයේ (ii) සඳහන් ඕනෑ ම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයේ 5 තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි තැන, පුත්තලම " කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහාලන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරික්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මසෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍ර සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩ කඩ සලසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුයි.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිලේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරී, පුත්තලම.

1970 ජනවාරි මස 12 වෙනි දින,
පුත්තලම, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | | | මාලු | මස් | කරවල | එළවලු | මාලු | මස් | කරවල | එළවළු |
| කල්පිටිය පර්යන්ත ඒකක ... | 100... | 800 | 70. 2.10 පෙ. ව. 10.00 ට | 500... | 500... | 500... | 2,000... | 1,000... | 1,000... | 1,000... | 4,200 |
| නවගත්තේගම ග්‍රාමීය රෝහල ... | 100... | 600 | | 200... | — ... | 300... | 700... | 600... | — ... | 1,300... | 2,500 |
| මහකුඹුක්කඩවල මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | — ... | 300... | 500... | 100... | — ... | 200... | 400 |
| මාම්පුරි මාතෘ නිවාසය ... | 100... | 300 | | 250... | 250... | 250... | 1,000... | 200... | 200... | 200... | 800 |

1–803—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කොළ/මීගමුව ශාන්ත පීතර මහා විද්‍යාලය | පන්ති කාමර ගොඩනැගිල්ලක් තැනීම. |

**සංලක්ෂ්‍යය :**—කොළ/කොළඹ උතුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රුපියල් 50,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි මස 12 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පියසිරි වන්නිආරච්චි,
ගම්පහ ප්‍රදේශයේ
වැ. බ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 11 වැනි දින,
ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

1–787—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

කාණු දෙකේ කොන්ක්‍රීට් නළ 5,000ක් සැපයීම සහ ගෙනවුත් භාරදීම සඳහා කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු විසින් 1970 පෙබරවාරි මස 16 වෙනි දින පෙ ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි මස 10 වෙනි දින දවල් 12 වනතෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවනට, ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගත හැකි වේ

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොටුව,
කොළඹ.

1–758—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### මුද්දර කවර සැපයීම

මුද්දර කවර සැපයීම සඳහා 1970 මාර්තු 5 දින පෙරවරු 10 දක්වා කොළඹ 1, මූලස්ථාන ගොඩනැගිල්ලේ, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටැන්ඩර් භාරගනු ලැබේ.

2. ටැන්ඩර් විවෘත කරන විට, ටැන්ඩර්කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ඇත. 1 වැනි ඡේදයේ සඳහන් දිනට හා වේලාවට පෝස්ට් මාස්ටර් ජනරාල් කායඕලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

3. කොළඹ 1, ප්‍රධාන තැපැල් කායඕලයයේ මූලස්ථාන කායඕල ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිගේ කායඕලයෙන් ඉල්ලුම් කිරීමෙන් 1970 මාර්තු මස 4 වැනි දින පෙ. ව. 10 දක්වා ලබාගතහැකි ෆෝර්ම මගින් ටැන්ඩර ඉදිරිපත් කළ හැක.

4. ටැන්ඩර සියල්ල දෙපිටපතකින් තිබිය යුතුය. ටැන්ඩර බහාලන ලියුම් කවරයේ වම් කොනේ "මුද්දර කවර සැපයීම සඳහා ටැන්ඩරය" යන්න ලකුණු කළ යුතු ය.

5. ටැන්ඩර, රෙජිස්තර තැපෑලෙන් යැවිය යුතුය. මෙරට ටැන්ඩර් කරුවකු මේ ආකාරයට ටැන්ඩරය යැවීමට අකමැතිවේ නම්, ඔහු සිය ටැන්ඩරය ලියුම් කවරයක බහා එහි මතුපිට ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කරන ලද විස්තර සහ ටැන්ඩරකරුගේ නම සහ ලිපිනය ලියා මුද්‍රා තබන ලද එම ටැන්ඩරය පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂගේ කායඕලයට භාරදී එය භාරගත් බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. කොළඹ 1, ප්‍රධාන තැපැල් කායඕලයේ 4 වැනි කවුන්ටරයේදී රුපියල් 50 ක ටැන්ඩර් තැන්පතුවක් කළ යුතු අතර, ටැන්ඩර් ආකෘතිපත් ලබා ගැනීමට කලින් ඒ පිළිබඳව කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. 1970 මාර්තු මස 4 වැනි දින පෙ. ව. 10 දක්වා ටැන්ඩර ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

7. නියමිත පරිදි සැම්පල් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම දෙපාර්තමේන්තුව, අමු ද්‍රව්‍ය සඳහා කිසිම ආනයන බලපත්‍රයක් නිකුත් කිරීමට නිර්දේශ නොකරන හෙයින්, එම ද්‍රව්‍ය ආනයන කිරීම සඳහා ආනයන බලපත්‍ර අවශ්‍ය නොවන එවැනි කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ටැන්ඩර් භාරගනු ලැබේ.

9. තවදුරටත් විස්තර සහ කොන්දේසි, කොළඹ 1, ප්‍ර. තැ. කායඕලයේ මූලස්ථාන කායඕලයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි වෙත ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

වර්නන් අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1,

1–759—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : පා/4/1/130.

## අම්පාර කච්චේරිය

පහත සඳහන් වැඩය සඳහා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක හෝ දිසාපති කාර්යාලයක කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචිව සිටින සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත් කරුවන් ගෙන් ද 1970 පෙබරවාරි 14 වන දින පෙ. ව. 11 දක්වා අම්පාර දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(1) අම්පාර දිසාපති කාර්යාලීය භූමියෙහි පොලිස් නිලධාරීන් සඳහා විවේක කාමරයක් ඉදිකිරීම.

2. දිවයිනේ පිහිටි ඕනෑම කච්චේරියක රු. 5 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් අම්පාර දිසාපති නමින් තැන්පත් කොට ලබා ගත් නිල කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම අම්පාර දිසාපති කාර්යාලයේ පාලන අංශයෙන් ලබා ගත හැක. ඉහත පළමුවන ඡේදයෙහි සඳහන් සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අවශ්‍ය නැත. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දින ප. ව. 1 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. පිටපත් දෙකකින් යුක්තව පැහැදිලි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ෆෝර්ම දිසාපති, කච්චේරිය, අම්පාර යන ලිපිනයට ලැබෙන සේ ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනතැනගේ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ඒවා තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම් පස කෙළවරේ........................ (වැඩයේ නම) සඳහා ටෙන්ඩර යන්න සඳහන් කළ යුතුය. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති හෝ නොපැහැදිලිව ලියා ඇති හෝ ටෙන්ඩර් පත්‍ර සලකා බැලීම පිණිස භාරගනු නොලැබේ.

4. 1970 පෙබරවාරි 14 වන දින ප. ව. 3 ට අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනතැනගේ කාමරයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. එසේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගෙන් ලිපියකින් බලයලත් නියෝජිතයෙකුට ඉඩ දෙනු ලැබේ.

5. ජයග්‍රාහක ටෙන්ඩර්කරු ඒ බව ඔහුට දැනුම් දෙන ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල් තැන්පත් කොට, සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම පිණිස අම්පාර දිසාපති සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. ඇපය ජයග්‍රාහක ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මුදලින් 5% කට නොවැඩි මුදලක් වනු ඇත. මෙසේ මෙම ගිවිසුමට ඇතුලත් වීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ නම, "වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුළත් කරනවා ඇත. තව ද ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ද ආපසු ගෙවනු නොලැබේ.

6. වැඩ පැහැර ඇති කොන්ත්‍රාත් කරුවකු ලෙස රජය පිළිගත් අයෙකු බව හෙලිවීම හෝ තමාට සැහේයයි පෙනී යන හේතුවක් නිසා හෝ මෙම සේවාව පැවරීමට එම අවස්ථාවේදී නුසුදුස් සකුයයි අම්පාර දිසාපතිට ඒත්තු යන කවර හෝ පුද්ගලයෙකු නැතහොත් සමිතියක් සමග වුව ද මෙකී ගිවිසුමට ඇතුළත්වීම එම දිසාපතිගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී ප්‍රතික්ෂෙප කළ හැකිය.

7. ටෙන්ඩර්කාර සමිතිවල සහිරත්වය සහ ක්‍රියාකාරී පැවැත්ම පිළිබඳව ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ, සමූපකාර සංවර්ධන කොමසාරිස්, කම්කරු උප කොමසාරිස් යන නිලධාරීන් අතුරින් අදාල නිලධාරියාගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුය. එකී සමිතිය මෙම කොන්ත්‍රාත්තුව පැවරීමට සුදුසු එකක් ද යන බවට එම නිලධාරියාගේ නිර්දේශය ද එම සහතිකයට ඇතුළත් විය යුතුය.

8. යම් කිසි ටෙන්ඩරයක් මුළුමනින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ නැතහොත් පිළිගැනීමේ අයිතිය අම්පාර දිසාපති සතුව පවතී.

9. ටෙන්ඩර් ෆෝර්ම ලබාගත් නමුත් ඒවා සම්පූර්ණ කොට අම්පාර දිසාපති වෙත ඉදිරිපත් නොකළ අයගේ සහ නියමිත කොන්දේසිවලට පටහැනිව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම නිසා නොපිළිගත් ටෙන්ඩර් පත්‍ර එවූ අයගේ ද ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. මේ පිළිබඳව වැඩි විස්තර සහ කොන්ත්‍රාත් කරු ඇතුළත් විය යුතු ගිවිසුමේ කොන්දේසි පිළිබඳව ද අම්පාර දිසාපති කාර්යාලයේ පාලන අංශයෙන් සාමාන්‍ය කාර්යාල කටයුතු කරන වේලාවකදී විමසා දැන ගත හැක.

වී. සී. බී. උනන්තැන්න,
අම්පාර දිසාපති.

1970 ක්වූ ජනවාරි 8 දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දී ය.

1–689—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ආර්ඩී/එච්/3/9

## කොළඹ කච්චේරිය

### කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ වඩු පාසැල්වලට ඉරාපු ලී සැපයීම පිළිබඳ මිළ ගණන් කැඳවීම

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් 1969.12.5 සහ අංක 14,883 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සම්බන්ධවයි. ටැන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970.2.20 දින දක්වා දීර්ඝ කොට තිබේ.

කේ. සී. සිල්වා,
සහකාර අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

තැ. පෙ. 1501,
දිසාපති කාර්යාලය, කොළඹ,
1970 ජනවාරි මස 8 වැනි දින.

1-686—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

ගුවන් විදුලි සංදේශ උපකරණ සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 මාර්තු මස 25 වෙනි බදාදා පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත ෆෝර්මවල ලියා අනු පිටපතකින් යුක්ත කොට එවිය යුතුය. එම ෆෝර්ම කොළ මගේ කාර්යාලයෙන් 1970 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා ප. ව. 3 වන තෙක් ලබාගත හැක. ඒවා නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් රු. 100ක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් දැනගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5, 70.1.12.

1–871—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

පාවිච්චි කළ ටයර් මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් 1970 පෙබරවාරි 10 වෙනි දින ප. ව. 3 දක්වා මවිසින් බාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| 750×20 ප්‍රමාණයේ ලොරි ටයර් | ... | 25 |
| 600×16 ප්‍රමාණයේ ලෑන්ඩ්රෝවර් ටයර් | ... | 8 |
| 165×380 ප්‍රමාණයේ කාර් ටයර් | ... | 7 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ අදාල කොන්දේසි කොළඹ, කොටුවේ, ඊස්ටර්න් බැංකු ගොඩනැගිල්ලේ තැ. පෙ. 363, තේ පාලකගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

තේ පාලක.

තේ පාලන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 363,
ඊස්ටර්න් බැංකු ගොඩනැගිල්ල,
කොළඹ 1.

1–757—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## මහාමාර්ග දෙපාර්තමේන්තුව—පාලම් සංවිධානය

කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රත්මලානේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් අංගනයේ ඇති මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර සූත්‍ර හා වාහන මිළදී ගැනීම හා ඉවත් කිරීම සඳහා 1970 ක්වූ පෙබරවාරි මස 18 දා පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| අංකය | විස්තරය | හැඳින්වීමේ අංකය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | ලොරිය ර.වැ.දෙ. 267 | සීවී 1628 | 1 |
| 2 | ලොරිය ර.වැ.දෙ. 226 | සීඊ 4548 | 1 |
| 3 | ලොරිය ර.වැ.දෙ. 260 | අයිසී 1057 | 1 |
| 4 | ලොරිය ර.වැ.දෙ. 269 | අයිසී 1334 | 1 |
| 5 | ඔස්ටින් පිජ්සී 346 | 2 ශ්‍රී 8931 | 1 |
| 6 | සීපීටී වායු පීඩන යන්ත්‍රය—ර.වැ.දෙ. 12 | — | 1 |
| 7 | රැන්සම් රේපියර් පොම්පය—ර.වැ.දෙ. 64 | — | 1 |
| 8 | රැන්සම් රේපියර් පොම්පය—ර.වැ.දෙ. 61 | — | 1 |
| 9 | ගිලන් රථය සීඇල් 986—ර.වැ.දෙ. 208 | — | 1 |
| 10 | බ්‍රෙඩ්ෆඩ් පොම්පය—ර.වැ.දෙ. 87... | — | 1 |
| 11 | බ්‍රෙඩ්ෆඩ් පොම්පය—ර.වැ.දෙ. 86... | — | 1 |
| 12 | ඉලෙක්ට්‍රික් ක්‍රෂර්—ර.වැ.දෙ. 17 | — | 1 |
| 13 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 1 | — | 1 |
| 14 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 3 | — | 1 |
| 15 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 4 | — | 1 |
| 16 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 6 | — | 1 |
| 17 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 7 | — | 1 |
| 18 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 8 | — | 1 |
| 19 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 9 | — | 1 |
| 20 | පවර් බැරෝස්—ර.වැ.දෙ. 10 | — | 1 |
| 21 | වසුන් තබන ලද මෝටර් පොම්ප—ර.වැ.දෙ. 110 | — | 1 |
| 22 | වසුන් තබන ලද මෝටර් පොම්ප—ර.වැ.දෙ. 111 | — | 1 |
| 23 | වසුන් තබන ලද මෝටර් පොම්ප—ර.වැ.දෙ. 112 | — | 1 |
| 24 | වසුන් තබන ලද මෝටර් පොම්ප—ර.වැ.දෙ. 113 | — | 1 |
| 25 | පර්සෝ වෑන්—ර.වැ.දෙ. 312 | 1 ශ්‍රී 438 | 1 |
| 26 | ලොරිය—ර.වැ.දෙ. 461 | 24 ශ්‍රී 274 | 1 |
| 27 | ලොරිය—ර.වැ.දෙ. 534 | 24 ශ්‍රී 1399 | 1 |
| 28 | ගල් ක්‍රෂර්—ර.වැ.දෙ. 6 | — | 1 |

2. රත්මලානේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුතැනගේ යාන්ත්‍රික අංශයේදී ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අවසාන දිනය තෙක් සතියේ දිනවලදී පෙරවරු 10 සිට දවල් 12 දක්වා යන්ත්‍ර සූත්‍ර හා වාහන පරීක්ෂා කළ හැක.

3. කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් හෝ කොළඹින් පිටත කච්චේරියකින් හෝ රු. 250 සඳහා නිකුත් කරන ලද ටෙන්ඩර් තැන්පත් කුවිතාන්සියක් රත්මලානේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කායඝාලයට ඉදිරිපත් කරමින්, ලබාගත් ෆෝර්මවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් සකස් කළයුතු වේ. 1970 පෙබරවාරි 11 දින පස්වරු 4 තෙක් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඉන්පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ දිනකට රු. 10 ක්වූ අමතර ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් පසු පමණකි. තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුවේ. ටෙන්ඩර් එවනු ලබන ලියුම් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ "පාලම් සංවිධානයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර සූත්‍ර හා වාහන මිළදී ගැනීම හා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. 1970 පෙබරවාරි 18 දින පෙරවරු 11.05 ට දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැක.

5. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවා ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර සූත්‍ර සහ වාහන, ටෙන්ඩරය භාර ගත් දිනයේ සිට දින දහයක් ඇතුලතදී පාලම් අංගනයෙන් ඉවත් කර ගත යුතුයි.

6. ලාංකිකයන්ට හා ලාංකික සමාගම් සහ කොම්පැණිවලට පමණක් ටෙන්ඩර් සීමා වෙත්. අසාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් සහ කොන්ත්‍රාත්තුව යටතේ බැඳී ඇති කාර්යයන් නිසි සේ ඉෂ්ඨ කරන ලද සාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත්ද අයදුම් අනුව ආපසු ගෙවනු ලැබේ.

ඇම්. චන්ද්‍රසේන,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කායඝාලය,
මහාමාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන.
1970 ජනවාරි මය 11 දින.

1-735—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ "ඒ" කොටසට අයත් රජයේ ගොඩනැගිලිවලට සුළු අළුත්වැඩියාකිරීම් හා ඒවා නඩත්තු කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉන්ජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1970 පෙබරවාරි මස 11 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 81,500 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1970 ජනවාරි මස 31 වැනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සූදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඒ. ආර්. රත්නරාජා,
අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි),
උ. මැ. කො., අනුරාධපුර.

1970 ජනවාරි මස 5 වෙනිදා,
අනුරාධපුර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ
අධිකාරී ඉංජිනේරු කාර්යාලය.

1-781/1—70.1.23 දින අංක 14,890 දරන ගැසට්

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ "බී" කොටසට අයත් රජයේ ගොඩනැගිලිවලට සුළු වැඩිදියුණුකිරීම් හා ඒවා නඩත්තු කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉන්ජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1970 පෙබරවාරි මස 11 වන බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 81,500 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1970 ජනවාරි මස 31 වැනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඒ. ආර්. රත්නරාජා,
අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි),
උ. මැ. කො., අනුරාධපුර.

1970 ජනවාරි මස 5 වෙනිදා,
අනුරාධපුර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ
අධිකාරී ඉංජිනේරු කාර්යාලය.

1-781/2—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ "බී" කොටසට අයත් රජයේ ගොඩනැගිලිවලට සුළු වැඩිදියුණු කිරීම් හා ඒවා නඩත්තු කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉන්ජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 පෙබරවාරි මස 11 වන බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ.දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 25,500 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජනවාරි මස 31 වැනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඒ. ආර්. රත්නරාජා,
අධිකාරී, ඉංජිනේරු (ගොඩනැගිලි),
උ. මැ. කො. අනුරාධපුර.

1970 ජනවාරි මස 5 වෙනිදා,
අනුරාධපුර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ,
අධිකාරී ඉංජිනේරු, කාර්යාලය.

1–781/3—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

යාපනයේ (කන්කසන්තුරේ) ආහාර ගබඩා තැනීම සඳහා වූ ටෙන්ඩර්පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 මාර්තු මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. යාපනයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා "ඒ" සහ "බී" ශ්‍රේණී යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝීලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්;
ගොඩනැගිලි අධ්‍යක්‍ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන් ස් වර්ක් ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970.1.16.

1–859/1—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මාතලේ ප්‍රාදේශීය බෙහෙත් ගබඩාව තැනීම සඳහා වූ ටෙන්ඩර්පත්, කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 මාර්තු මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,54,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝීලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්‍ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන් ස් වර්ක් ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970.1.16.

1–859/2—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මීරහවත්තේ මැදි බෙහෙත් ශාලාවේ ඇඳන් 14 ක මාතෘ වාට්ටුවක් තැනීම සඳහා වූ ටෙන්ඩර්පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 මාර්තු මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,06,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970.1.16.

1–859/9—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

පහත දක්වා ඇති ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර් රථ ටයර්, ට්‍යුබ් හා අනෙකුත් විවිධ උපකරණ 1970 පෙබරවාරි මස 12 දින පූ. භා. 10 ට කොළඹ 1, ඇචිලන් චතුරශ්‍රයෙහි පිහිටි සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැනගේ කාර්යාලයට යාබද ගරාජයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අපේක්ෂක ඉල්ලුම්කරුවන්ට මෙම භාණ්ඩ වෙන්දේසියට පෙර දින (1970 පෙබරවාරි 11 දින) කාර්යාල වේලාවන් තුල දී (පෙ. ව. 9 සිට 4.30 දක්වා) ඉහත කී ස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසිය අවසන් වූ විගස ම මුදල් ගෙවා බඩු ඉවත් කරගත යුතුය.

වී. අතිරණ,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්.

1970.1.11 දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
ආදිපාද වීදිය, තැපැල් පෙට්ටිය 419,
කොළඹ 1.

| වර්ගය | | | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. ජීප් ටයර් | ... | ... | 25 |
| 2. කාර් ටයර් | ... | ... | 37 |
| 3. කාර් ට්‍යුබ් | ... | ... | 16 |
| 4. විදුලි කේතල | ... | ... | 3 |
| 5. කැරම් බෝඩ් | ... | ... | 3 |
| 6. කොම්ටෝමීටර් | ... | ... | 2 |
| 7. පෑන් ශුද්ධ කරන | ... | ... | 6 |
| 8. පාපැදි | ... | ... | 2 |
| 9. බිත්ති ඔර්ලෝසු | ... | ... | 6 |
| 10. පංක්චර් සිදුරු එක | ... | ... | 1 |
| 11. පංක්චර් සිදුරු දෙක | ... | ... | 15 |
| 12. පංක්චර් සිදුරු හතර | ... | ... | 2 |
| 13. යතුරු ලියන (ඉංග්‍රීසි) (ඉම්පීරියල් එකයි)<br>යතුරු ලියන (ඉංග්‍රීසි) (ඉම්පීරියල් එකයි) | | ... | 2 |
| 14. යතුරු ලියන සිංහල (ක්‍රිස්ටෝ පෝටබල් දෙකයි)<br>යතුරු ලියන සිංහල ඉම්පීරියල් එකයි | | | 3 |
| 15. මේස පංකා විදුලි | ... | ... | 1 |
| 16. කෑන් රෙජිස්ටර් | ... | ... | 1 |
| 17. මෝටර් රථ අමතර කොටස් | | | |

1–857—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## පරණ බඩු වෙන්දේසිය

මෙහි පහත දැක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි බඩු සහ පරන නිල ඇඳුම් කොටස් 1970.2.27 වැනි දින පෙරවරු 10 ට හලාවත පොලිස් ස්ථාන භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ දී බඩු ගන්නා අයවලුන් එවලේම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගැනීමටත් එම බඩු වෙන්දේසිය අවසන් වූ වහාම ඉවත් කර ගැනීමටත් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| බැරල් | 1 සි | බෙර තොප්පි | 1 සි |
| හිස් ඇසිඩ් ජාරු | 2 සි | බොත්තන් නැති | |
| පරන බයිසිකල් සීට් | 6 සි | ඇල තොප්පි | 126 සි |
| ගැලුමේ හිස් ටින් | 8 සි | කැසි හෙල්මට් තොප්පි | 1 සි |
| ගැලුම් 4රේ හිස් ටින් | 30 සි | කාකි හට කබා | 29 සි |
| පරන පාපැදි | 9 සි | කාකි කැලෑ කබා | 10 සි |
| හම්පටි | 11 සි | කාකි කොට කලිසන් | 42 සි |
| බූට් සපත්තු ජෝඩු | 32 සි | කොහු මෙට්ට | 24 සි |
| හම් සපත්තු ජෝඩු | 191 සි | සුදු දිග කලිසන් | 1 සි |
| කැන්වස් සපත්තු කුට්ටම් | 4 සි | රයිපල් රාක්ක | 3 සි |
| නිල ඇඳුම් ඇතිරිලි | 20 සි | අත් නැති පුටු | 6 සි |
| වැහි කබා කලු | 1 සි | ජී. ඕ. එච්. පුටු | 10 සි |
| කාකි වැහි කබා | 5 සි | ඇලුමිනියම් පෑන් | 5 සි |
| වැහි කබා පටි | 5 සි | ඉංග්‍රීසි යතුරු ලියන | 2 සි |
| සුදු හට කබා | 1 සි | ගුවන් විදුලි යන්ත්‍ර | 1 සි |

ඒ. නවරත්නම්,
(බ) වයඹ පලාතේ සහකාර පොලිස් අධිකාරී.

පොලිස් කාර්යාලය,
හලාවත, 1970.1.9.

1–653/1—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## පාවිච්චියට ගත නොහැකි බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

වෂී 1970 පෙබරවාරි 7 දින පෙරවරු 10 ට රාගම මහර බන්ධනාගාරයේ පාවිච්චියට ගත නොහැකි පහත සඳහන් බඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ විකුණනු ලබන එක් එක් භාණ්ඩයන් සඳහා මුදල් එවේලේම ගෙවා වෙන්දේසිය අවසන් වූ වහාම බඩු ගෙන ගිය යුතුය.

| | | | |
|---|---|---|---|
| ආර්. සී. ඒ. ඇම්පිලිපයර් යන්ත්‍ර | ... | ... | 1 යි |
| ගුවන් විදුලි යන්ත්‍ර සඳහා ඩිටෙක්ටර් ස්ටේජ් | | ... | 1 යි |
| ශබ්ද විකාශණයන් | ... | ... | 12 යි |
| ශබ්ද විකාශනයන් පිනික්ස් ජූනියර් | ... | ... | 1 යි |
| කැරම් ලෑලි | ... | ... | 1 යි |
| යතුරු සේප්පු (ලී, කැබලි වලින්) | ... | ... | 1 යි |
| වංගෙඩි ලී | ... | ... | 3 යි |
| බේකරි හබල් | ... | ... | 2 යි |
| මෝල් ගස් | ... | ... | 1 යි |
| වතුර ගෙනයන පොලු | ... | ... | 3 යි |
| ආරෝග්‍යශාලා ස්ථාම (සාමාන්‍ය) | ... | ... | 1 යි |
| ස්ටූල්ස් සාමාන්‍ය (ලී කැබලි වලින්) | ... | ... | 1 යි |
| බත් බන්දේසි | ... | ... | 3 යි |
| වොලි බෝල | ... | ... | 2 යි |
| හෑන්ඩ් ට්‍රී | ... | ... | 1 යි |
| රෙදි වියන යන්ත්‍ර වල බීම් | ... | ... | 15 යි |

ජේ. පී. දෙල්ගොඩ,
අධිකාරි,
මහර බන්ධනාගාරය, රාගම.

දිනය : 70.1.23.

1–608—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් ඇන්ජින් වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ.ව. 9.30ට සිදු කරනු ලැබේ :—

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂාකර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින්ම කළ යුතුය :

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් 1/4 ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි 3/4 කොටස දින 3 ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුවද, යම් ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ දින 14 ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී ඇන්ජිමේ විකුණුම් මිළෙන් 1/4 ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. එම ලන්සුව පිළිගනු ලැබුවහොත් විකුණුම් මිළෙන් ඉතිරි 3/4 මුදල අවසාන පිළිගැනීමේ දන්වීම එවා දින 3 ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමිවීමයි. ලන්සුව ප්‍රතික්ෂෙප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමියෙහිම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ටී 62 | අ.බ. 8 යන්මාර් | ධීවර කාර්යාලය, තොඩ්ඩවේලි | 1970.3.18 |
| ටීඑස් 24 | අ.බ. 12 3/4 ලිස්ටර් | එම | එම |
| එස් 379 | අ.බ. 24 ටෝර්පිඩෝ | එම | එම |
| එස්අයිසී 58 | ටෝර්පිඩෝ ඇන්ජිමේ ප්‍රොපෙලරය, ෂාප්ට් එක, ඩීසල් ඉන්ධන පොම්පය ආදී කොටස් | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 1970.2.25 |
| — | ඇලිසා ග්‍රෙග් (අංක 178-සීඑෆ්ජ් 10842) | සුගතදාස යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 1970.2.27 |
| එස්අයිසී 127 | ටෝර්පිඩෝ | ධීවර කාර්‍යාලය, මුලතිව් | එම |
| එස්අයිසී 102 | ටෝර්පිඩෝ | එම | එම |
| ටීඑස් 59 | බුක් | ධීවර කාර්‍යාලය, පේදුරුතුඩුව | 1970.3.24 |
| වීජේ 16 | පර්කින්ස් | එම | එම |
| එම්සී 108 | බුක් | එම | එම |
| එම්ජේඩී 10 | ලිස්ටර් | එම | එම |
| ටීඑස් 22 | ලිස්ටර් | එම | එම |
| ඔසී 1 | ලිස්ටර් | එම | එම |
| එස් 196 | බුක් | එම | එම |
| ජේබී 91 | බුක් | එම | එම |
| වී 6 | බුක් | එම | එම |
| ටීඑස් 51 | ලිස්ටර් | එම | එම |
| වීකේඑස් 30 | ඇලිසා ග්‍රෙග් | ධීවර කාර්යාලය, කන්කසන්තුරේ | 1970.3.25 |
| වීකේඑස් 31 | ඇලිසා ග්‍රෙග් | එම | එම |
| එස්අයිසී 77 | ටෝර්පිඩෝ | එම | එම |
| එස් 376 | ටෝර්පිඩෝ | ලේඩන් ගරාජය, කයිට්ස් | 1970.3.20 |
| ජේබී 61 | පර්කින්ස් | ධීවර කාර්යාලය, කයිට්ස් | එම |
| එස්අයිසී 64 | ටෝර්පිඩෝ | එම | එම |
| වීකේඑස් 47 | බුක් | එම | එම |
| එස් 381 | ටෝර්පිඩෝ | එම | එම |
| ඩීඩී 6 | අ.බ. 22 ලිස්ටර් | එම | එම |
| එස්අයිසී 126 | ටෝර්පිඩෝ | ධීවර කාර්‍යාලය තාලයාඩි | 1970.2.26 |
| එස්. 382 | බුක් සිලි. 2 | එම | එම |
| ජේපීඑෆ්ජ් 53 | ඇලිසා ග්‍රෙග් | ධීවර කාර්‍යාලය, වෙන්කලාඩි | 1970.3.2 |
| ටී 48 | අ.බ. 8 යන්මාර් | ධීවර කාර්‍යාලය, මඩකලපුව | 1970.3.1 |
| ටී 106 | අ.බ. 11 බුක් | ප්‍රාදේශීය ධීවර කාර්‍යාලය, මීගමුව | 1970.3.25 |
| ටී 88 | අ.බ. ඩියුට්ස් | එම | එම |
| එස් 388 | ටෝර්පිඩෝ | ධීවර කාර්‍යාලය, ත්‍රිකුණාමලය | 1970.2.22 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 10 වැනිදා,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

1–683—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිත වූ/රහිත වූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිත වූ/රහිත වූ ටොන් $3\frac{1}{2}$ රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී සහ ස්ථානයන්හිදී පෙ. ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. උපලේඛනයෙහි සඳහන් ස්ථානයන්හිදී මෙම යාත්‍රා පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින් ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ කොටස දින 3 ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුවද, යම් යාත්‍රාවක්/ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ දින 14 ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථා වලදී යාත්‍රාවේ/ඇන්ජිමේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. එම ලන්සුව පිළිගනු ලැබුව හොත් විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ මුදල අවසාන පිළිගැනීමේ දැන්වීම එවා දින 3 ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමිවීමයි. ලන්සුව ප්‍රතික්ෂෙප කරනු ලැබුව හොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කර ගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමි භාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ජේපීඑෆ් 11 | — | හැරිසන්ස් ලිස්ටර් යාත්‍රාංගනය, කොම්පඤ්ඤ වීදිය | |
| එම්සී 5 | — | එම | 1970.2.22 |
| එස් 175 | ඇලිසා ශ්‍රේග් | එම | |
| එස්අයිසී 105 | අ.බ. 24 ටෝර්පිඩෝ | මෝදර වෙරළ | 1970. 2.23 |
| එස් 118 | — | එම්. ජේ. ඩයස් යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 1970. 2.24 |
| එස් 275 | — | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍රා දියත් කරන ස්ථානය, මට්ටක්කුලිය | |
| එස්අයිසී 42 | ටෝර්පිඩෝ | එම | |
| එස් 298 | — | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍රාංගනය—මට්ටක්කුලිය | |
| එස් 292 | — | එම | |
| එස් 289 | — | එම | 1970. 2.25 |
| එස්අයිසී 63 | — | එම | |
| එස්අයිසී 78 | — | එම | |
| එස්අයිසී 55 | — | එම | |
| එස්අයිසී 51 | — | එම | |
| එස් 10 | — | විම්ස්ටාර් යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 1970. 2.26 |
| ආර්එස් 9 | අ.බ. 30 පර්කින්ස් (බ්ලොක් එක පමණි) | අභ්‍යන්තර වරාය පාර, ත්‍රිකුණාමලය | |
| එස්අයිසී 43 | — | එම | |
| එස්අයිසී 129 | ටෝර්පිඩෝ | එම | 1970. 2.22 |
| එස් 385 | ටෝර්පිඩෝ | එම | |
| එස් 144 | යන්මාර් සිලි. 2 | එම | |
| ටී 235 | — | සිලෝන් ෂිප් යාත්‍රාංගනය, වයිනා බේ | 1970. 2.23 |
| එස් 388 | — | එම | |
| එස් 71 | ලිස්ටර් | රා. ලං. නා. හමුදා භූමිභාගය, ත්‍රිකුණාමලය | 1970. 2.24 |
| ටීඑස් 61 | — | සවුත් බාර්, මන්නාරම | 1970. 2.25 |
| ජේබී 84 | — | වන්කාලෙයි | 1970. 2.26 |
| එස් 117 | — | සෙල්වම් යාත්‍රාංගනය, මුලතිව් | 1970. 2.27 |
| වීකේඑස් 33 | අ.බ. 18 ලිස්ටර් | කීරමලෙයි, කන්කසන්තුරේ | 1970. 3. 2 |
| ඩීසී 28 | අ.බ. 20 ලිස්ටර් | ඩිවලොප්මන්ට් යාත්‍රාංගනය, කන්කසන්තුරේ | 1970. 3. 3 |
| එස්අයිසී 13 | — | ඩිවලොප්මන්ට් යාත්‍රාංගනය අසල | |
| එස් 335 | පර්කින්ස් | මයිලිඩ්ඩි වෙරළ | 1970. 3. 4 |
| එම්සී 135 | — | ඉමපැරිඩ්ඩි වෙරළ, පේදුරු තුඩුව | 1970. 3. 5 |
| එම්සී 30 | — | වේලානෙයි | 1970. 3. 9 |
| එස්අයිසී 126 | — | තාලයාඩි | 1970. 2.26 |
| ආර්එස් 3 | — | පවර් ක්‍රාෆ්ට් යාත්‍රාංගනය, යාපනය | |
| එස්අයිසී 84 | අ.බ. 24 ටෝර්පිඩෝ | එම | |
| එම්සී 83 | — | එම | 1970. 3.11 |
| ටී 136 | අ.බ. 10 බුක් | එම | |
| ඩීසී 4 | — | වැල්වැටිතුරේ වෙරළ (කොට්ටියාර්) | 1970. 3.10 |
| කේඑස්එල් 3 | — | කරෙයියූර් | 1970. 3.12 |
| ටී 86 | ඩයියා | ධීවර වරාය, කරෙයියූර් | |
| ඩීසී 29 | — | කරෙයිනගර් | 1970. 3.13 |
| එස්අයිසී 93 | අ.බ. 24 ටෝර්පිඩෝ | මාතගල් වෙරළ | 1970. 3.14 |
| එස් 196 | — | ධීවර වරාය, යාපනය | |
| එස්අයිසී 69 | ටෝර්පිඩෝ | එම | |
| ජේබී 91 | — | එම | 1970. 3.17 |
| ජීඒපී 5 | — | එම | |
| එම්සී 48 | — | එම | |
| එම්සී 84 | — | කරිකෝප්පු | 1970. 3.18 |
| ටීඑස් 51 | — | එම | |
| ටීඑස් 59 | — | කයිට්ස් | 1970. 3.20 |
| එස් 100 | — | එස්අයිසී යාත්‍රාංගනය, කොග්ගල | 1970. 3. 5 |

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| එස් 14 | — | මිරිස්ස වෙරළ | 1970.3.9 |
| එම්සී 85 | — | දෙවුන්දර වෙරළ | 1970.3.10 |
| ටී 300 | — | කොට්ටෙගොඩ ඔරුවැල්ල | 1970.3.11 |
| එස් 68 | — | කංගල්ල වෙරළ | 1970.3.12 |
| එස් 3 | — | ජේපීඑෆ් යාත්‍රාංගනය, මීගමුව | 1970.3.9 |
| වීජේ 1 | — | වීජේ යාත්‍රාංගනය, මීගමුව | 1970.3.10 |
| ටී 14 | — | මීගමුව වෙරළ | 1970.3.11 |
| එස් 38 | ඩියුට්ස් | එම | 1970.3.11 |
| ටී 346 | — | ලූකස් යාත්‍රාංගනය, පානදුර | 1970.3.13 |
| ටී 175 | අ.බ. 8 යන්මාර් | කටුකුරුන්ද යාත්‍රා සාදන්නන්ගේ සමුපකාර සමිතියේ යාත්‍රාංගනය, උතුරු කළුතර | 1970.3.14 |
| කේබීබී 1 | — | එම | 1970.3.14 |
| එල් 2 | ලිස්ටර් | එම | 1970.3.14 |
| වීජේ 6 | — | එම | 1970.3.14 |
| එස් 189 | — | නවලංකා යාත්‍රාංගනය, බේරුවල | 1970.3.16 |
| ජීජ්පී 3 | — | බලපිටිය ධීවර කාර්යාලය අසල | 1970.3.17 |
| ජේබී 10 | — | එම | 1970.3.17 |
| එස් 247 | — | බලපිටිය පාලම අසල | 1970.3.17 |

1970.1.10 වෙනි දින,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1–684—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

**දික්ඔය කෙළින් වීදියේ අංක 351 දරණ නිවසේ පදිංචි සුබ්‍රමනියම් දුරෙයිසාමි, සුබ්‍රමනියම් සිවඥානම් සහ ඔහුගේ බිරිඳ වන ලෝගා පරමේශ්වරී සිවඥානම්ට අයිති, මැද පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ, උඩබුලත්ගම පත්තුවේ හැටන්-දික්ඔය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ, දික්ඔය නගරයේ පිහිටි, දික්ඔය කඩවීදි සැලැස්මේ අංක 73 දරණ කැබැල්ල යනුවෙන් සටහන් කර ඇති පර්චස් 03.13ක ප්‍රමාණයෙන් යුත් වටිනා බිම් කැබැල්ල සහ එහි පිහිටි වරිපනම් අංක 351 දරණ ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ**

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 62 (1) දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද විශේෂ තීරණයක් විධිමත්ව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිඛ කිරීමෙන්, ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලය ලත් පරිදි, 1959 නොවැම්බර් මස 14 සහ 30 වෙනි දින සී. සී. සෝමසේගරම් ප්‍රසිඛ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 5644 දරණ උගස්කරය පිට, දික්ඔය, කෙළින් වීදියේ අංක 351 දරණ නිවසේ පදිංචි සුබ්‍රමනියම් දුරෙයිසාමි, සුබ්‍රමනියම් සිවඥානම් සහ ඔහුගේ බිරිඳ වන ලෝගා පරමේශ්වරී සිවඥානම් යන අය විසින් මෙම බැංකුවට උගස් කරන ලද, බලය ලත් මිනින්දෝරුවන් වන ජොන්ක්ලස් සහ සමාගමේ ජේ. එච්. ආර්. පෙරින්පනායගම් විසින් 1956 නොවැම්බර් 20 වෙනි දින සාදන ලද දික්ඔය කඩවීදි මිනුම් සැලැස්මේ අංක 73 දරණ කැබැල්ල යනුවෙන් සටහන් කර ඇති, පර්චස් තුනකුත් දශම එකයි තුන (අ. 0, රූ. 0, පර්. 03.13) ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද බිම් කැබැල්ල සහ එහි පිහිටි වරිපනම් අංක 351 දරණ ගොඩනැගිල්ල, ඉහත කී උගස්කරය පිට අය විය යුතු මුදල වන රු. 8,854.92ක් අය කරගනු සඳහාත්, 1965.2.12 දින සිට වෙන්දේසිය සිදුකරන දින දක්වා රු. 7,592.95කට අවුරුද්දකට සියයට 5 1/2 බැගින් පොළී අය කර ගනු සඳහාත්, ලංකා රජයේ උගස් බැංකු ආඥා පනතේ 63 වන වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් සහ අනෙකුත් මුදල් ද අය කරගනු සඳහා, 1970 පෙබරවාරි 27 වන සිකුරාදා පෙරවරු 11ට එය පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිඛ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ, හෝටන් පෙදෙසේ, අංක 91 දරණ ස්ථානයේ පිහිටි ලංකා රජයේ උගස් බැංකුවෙන් ලබාගත හැක.

ලොයිඩ් සමරවික්‍රම,
බලය ලත් වෙන්දේසිකරු.

24, ටොරිංටන් පාර,
මහනුවර.

1–864—70.1.23 දින අංක 14,890 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 70. 1. 2 | සිකුරාද | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1. 9 | සිකුරාද | 70. 1. 2 | සිකුරාද | ප ව | 3 30 |
| | 70. 1.16 | සිකුරාද | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 1.23 | සිකුරාද | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 | බ්‍රහස්පතින්ද | 70. 1.21 | බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | 70. 2.13 | සිකුරාද | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | 70. 2.20 | සිකුරාද | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 2.27 | සිකුරාද | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 | සිකුරාද | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 | සිකුරාද | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 | බ්‍රහස්පතින්ද | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි